උපුල් ජෝෂප් ප්‍රනාන්දුගේ
ගුරුදු විග්‍රහය

රු.100

2026.07.19 ඉරිදා | හත්වැනි කාණ්ඩය | 52 වැනි කලාපය

දැන් ඉරිදා

# මව්බිම




## වමටද බර?

P » 04






## උතුරු නැගෙනහිර වතුකරය එකම පෙරමුණකට

# පළාත් සභා ඡන්දය ගන්න ලොකු සටනක් ඇරැඹෙයි

P » 02



## හිටපු පොලිස්පති මැරුවද? මැරුණද?

මොකක්ද මේ අබිරහස

P » 02

## ජවිපෙ-මාලිමාව රට පුරා පාරට බහින සූදානමක්

P » 02

## 23 වැනිදා සජිත් මුළු විපක්ෂයම කොළඹට කැඳවයි

පාර්ලිමේන්තුව නියෝජනය කරන සහ නියෝජනය නොකරන විපක්ෂයේ සියලු දේශපාලන පක්ෂ ලබන බ්‍රහස්පතින්දා (23) දිනයේ විපක්ෂ නායක කාර්යාලයට කැඳවීමට විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා කටයුතු කොට තිබේ. අගවිනිසුරුවරයාගේ සහ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු දෙකකින් දීර්ඝ කිරීමට ආණ්ඩුව දරන උත්සාහයට එරෙහිව දැවැන්ත සටනක් ආරම්භ කිරීම...

P » 02



## ඩෙංගු රෝගීන් ලක්ෂයට කිට්ටු කරයි

50ක් මැරිලා

P » 02

## ගෙවල් ඇතුළේ ආර්ථිකය 51.4%කින් කඩාවැටිලා

ජන මතයකින් හෙළිවෙයි

P » 02

## ජනාධිපති කෝච්චි බස් ගැන දැඩි තීන්දුවක් ගනී

P » 02

2029 වසරේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය නැවත වතාවක් දෙකොන් සටනක් වීමේ ඉඟි පහළ කොට ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් සිදුකළ නවතම සමීක්ෂණයක් මගින් අනාවරණ කොට තිබේ. ඒ අනුව, ඔවුන්ගේ නවතම සමීක්ෂණයකින් පෙන්වා දී ඇත්තේ මේ වනවිට රටේ ඉහළම ජනප්‍රසාදයක් සහිත නායකයන්...

P » 02

## රනිල් නාමල් දිලිත් 29 තරගයෙන් අවුට්

## 27 වැනිදා මහා සංසරත්නය කොළඹට

P » 02




AA-(lka) Fitch ශ්‍රේණිගත කිරීම. සන්නාම ශ්‍රේණිගත කිරීම: AAA- (Brand Finance Lanka)
ලංකා බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.
යෝජනා/අදහස්/පැමිණිලි සඳහා - https://www.boc.lk/contact

ලංකා බැංකුව හඳුන්වාදෙන 'Prosperity' ස්ථාවර තැන්පතු ගිණුම

| වසර 2 තැන්පතු සඳහා | |
|---|---|
| 10.50% (වා.පො.) (වා.ස.පො.අ. 10%) | පොලී ගෙවීම කල්පිරීමේ දී / රුපියල් 250,000/- සිට ඇරඹිය හැකිය |

| වසර 3 තැන්පතු සඳහා | |
|---|---|
| 11.00% (වා.පො.) (වා.ස.පො.අ. 9.97%) | පොලී ගෙවීම කල්පිරීමේ දී / රුපියල් 250,000/- සිට ඇරඹිය හැකිය |

| වසර 5 තැන්පතු සඳහා | |
|---|---|
| 12.00% (වා.පො.) (වා.ස.පො.අ. 9.86%) | පොලී ගෙවීම කල්පිරීමේ දී / රුපියල් 250,000/- සිට ඇරඹිය හැකිය |

| වසර 7 තැන්පතු සඳහා | |
|---|---|
| 12.50% (වා.පො.) (වා.ස.පො.අ. 9.40%) | පොලී ගෙවීම කල්පිරීමේ දී / රුපියල් 1,000,000/- සිට ඇරඹිය හැකිය |

- ආකර්ෂණීය පොලී අනුපාත
- අවශ්‍යතාවය මත තෝරාගත හැකි විවිධ කාල සී...
- විවිධ පොලී ගෙවීම් ක්‍රම
- තැන්පතුව මත ණය පහසුකම්
- ස්වයංක්‍රීය අලුත් කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය බැංකුවෙන් පිරිනැමෙන වඩාත්ම ආකර්ෂණීය සහ විශ්වාසවන්ත තැන්පතු ගිණුම සමගින් ඔබේ අනාගතය සුරක්ෂිත කරගන්න.

වැඩි විස්තර සඳහා ළඟම ලංකා බැංකු ශාඛාවට පිවිසෙන්න නැතහොත් 1975 අමතන්න.

ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය, අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.

ලංකා බැංකුව BOC ජාතියේ මහා පහන් ටැඹ

P » 02

# ආදරයද? සල්ලිද?

# පානදුරේ නදුනිටත් වුණේ තෙල්දෙණියේ හෞත චිකිත්සකවරියට වෙච්ච දේමද?

**පානදුරේ ගොරකාන ගල්කණුව ප්‍රදේශයේ පිහිටි එක් නිවසක් වටා දින කිහිපයක් තිස්සේ පැතිර ගියේ අමුතු නිහඬතාවක්. ඒ නිවසේ දොර දින කිහිපයක් තිස්සේ විවෘත වූයේ නැත. කිසිවකු ඊට ඇතුළු වී තිබුණේද නැත. එහෙත් නිවස තුළ සිටි සුනඛයන් නොනවත්වා බුරන්නට වුණා. ඒ බිරීම තුළ යම් අසරණකමක් තිබෙන්නට ඇත. ඇතැම් විට ඒ සතුන් යම් අනතුරක් පිළිබඳ ප්‍රදේශවාසීන්ට දැනුම් දෙන්නට උත්සාහ කළා වන්නටද පුළුවන. මේ අතර, අසල්වැසියන්ට එම නිවස ආශ්‍රිතව පැතිර යමින් තිබුණු අධික දුර්ගන්ධයක්ද වහනය වී තිබුණා.**

මේ කතාවේ කතා නායිකාව වුණේ නදුනි. ඇය ජීවත් වුණේ පානදුර ගොරකාන ප්‍රදේශයේ බෝඩිම් කාමරයකයි. ඇය කාගේත් සිත් ඇද බැඳ ගන්නට සමත් රූ සපුවකින් යුතු තරුණියක වූවා. බෝඩිමක ජීවත් වූ ඇගේ ස්ථිර පදිංචිය වුණේ පානදුර උතුර වඩුමඩුව හන්දිය ප්‍රදේශයේයි. ඇය විවාහ ගිවිසගෙන තිබුණේ ගුවන් නියමුවකු සමගයි. කෙසේ වෙතත් එම යුවළට එක්ව ජීවත්වීමට නොහැකි වීම නිසා එම විවාහය අවලංගු වී ඇති බවයි දැනගන්නට ලැබුණේ. සුනඛයන්ට දැඩි ලෙස ඇලුම් කළ නදුනි සුනඛයන් කිහිප දෙනකු ඇතිදැඩි කළේ මහත් ආදරයෙනි. නමුත් අසල්වැසියන් සුනඛයන් ඇතිදැඩි කිරීමට විරෝධය පෑම නිසා ඇය එම සුනඛයන්ද රැගෙන පානදුර ගොරකාන ප්‍රදේශයේ කුලී කාමරයකට ගොස් තිබුණා. එහි සිට ඇය පානදුර ප්‍රදේශයේ හෝටලයක රැකියාවකට ගොස් ඇති අතර, එම හෝටලයේ සේවය කළ නවෝද්‍ය ලක්මාල් ජයවර්ධන නමැති 22 හැවිරිදි තරුණයකු සමග ඇය පෙමින් වෙළී තිබුණා. කලක් ගතවෙද්දී ලක්මාල් නදුනිගේ බෝඩිම් කාමරයට එන්නට යන්නට කටයුතු කර තිබුණා. මේ අතර නදුනි එම හෝටලයේම ප්‍රධාන කෝකියා ලෙස සේවය කළ කැකිරාව කිරිගස්වැව පදිංචි දෙනුවන් ප්‍රමෝද නමැත්තා සමගද සමීප සබඳතාවක් ගොඩනගාගෙන ඇත.

24 හැවිරිදි දෙනුවන් ඇයට දැඩි ලෙස ආදරය කළ අතර, ඇගේ වියදම් සහ බෝඩිම් කුලිය සඳහා මාසිකව රුපියල් 35,000ක මුදලක් ලබාදී ඇති බවද අනාවරණ වී තිබේ. සමහර දිනවල දෙනුවන් නදුනිගේ බෝඩිම් කාමරයේ රැය පහන් කිරීමටද හුරුව සිටියා. කෙසේ වෙතත් තුන්කොන් ආදරයක් වූ මෙයට නදුනිගේ හෝ දෙනුවන්ගේ විරෝධයක් එල්ලවී ඇති බවක් නොපෙනුණේ ඔහුගෙන් මාසිකව ලැබෙන මුදල් නිසා බව පැවසෙයි.

නදුනිගේ මවද නදුනිගේ මෙම සබඳතාවන් ගැන දැන සිට ඇති අතර, දෙනුවන් මවගෙන් විමසා සිටියදී මව පවසා ඇත්තේ නදුනි සහ ලක්මාල් අතර ඇත්තේ මිත්‍රත්වයක් පමණක් බවයි. මීට පෙර ලක්මාල්ගේ පියා නදුනි සහ තම පුතා අතර පවතින සම්බන්ධතාව දැන ඊට විරෝධය පා ඇති අතර, පියා විසින් දෙදෙනාටම තර්ජනය කිරීමටද කටයුතු කර තිබුණා.

මේ හේතුවෙන් ලක්මාල් තමන්ගේ ඇඳුම්ද රැගෙන නදුනිගේ බෝඩිමට යාමට කටයුතු කර තිබුණු අතර, නදුනි පානදුර පොලිසියට ගොස් පැමිණිල්ලක් ගොනුකර තිබුණා. පැමිණිල්ල සමථ මණ්ඩලයට යොමුකිරීමෙන් අනතුරුව දෙදෙනා අවුරුදු 16ට වැඩි නිසා කැමති කෙනකු විවාහ කරගැනීමේ නිදහස ඔවුන් සතු බව පැහැදිලි කරදී ඇත. මේ අතර, දෙනුවන් නදුනිගේ කාමරයට යන සෑම අවස්ථාවකම ඒ බව නදුනිගේ මවට දැනුම් දීමටද කටයුතු කර ඇත. ඒ අනුව දිනක් මව කුලී නිවසට ගොස් ඇති අතර, එවිට නිවසේ දොර වසා තිබූ නිසා ඇය නැවත ගොස් ඇති බවයි පරීක්ෂණවලින් හෙළිව තිබුණේ. මවගේ දුරකතන ඇමතුම්වලටද දියණියගෙන් ප්‍රතිචාර නොලැබී තිබූ අතර, කුලී නිවසේ අවට නදුනිගේ ඇඳුම් විසිර තිබෙන අයුරුද මවට දැකගන්නට ලැබී ඇත.

මේ අතර, දෙනුවන් නදුනිගේ අතුරුදන්වීම දරාගැනීමට නොහැකිව නදුනිගේ මව සමග පසුගිය 05 වැනිදා කුලී නිවසට ගොස් ඇති අතර, ඒ වනවිට නිවස තුළින් දරාගත නොහැකි දුර්ගන්ධයක් වහනය වෙමින් තිබී ඇත. එවිට දෙනුවන් නදුනිගේ කුළී නිවසේ දොර කඩා ඊට ඇතුළු වී ඇති අතර, එහිදී දුටු දෙයින් ඔවුන්ට දෑස් අදහාගැනීමට පවා නොහැකි වී තිබේ. ඒ අනුව වහාම 119 හදිසි ඇමතුම් අංකයට දැනුම් දෙන්නට ඔවුන් කටයුතු කර තිබුණා.

එම ඇමතුමෙන් වහාම ක්‍රියාත්මක වූ පානදුර උතුර පොලිසියේ ස්ථානාධිපති තිස්ස සරත්චන්ද්‍ර මහතා ඇතුළු නිලධාරීන් මේ සිදුවීම වූ ස්ථානයට ළඟාවුණා. එම ස්ථානයේ තිබී ලක්මාල්ගේ ඇඳුම් කිහිපයක්, ජංගම දුරකතනයක්, පිහියක් සහ ඔහුගේ ජාතික හැඳුනුම්පතද සොයාගැනීමට පොලිසියට හැකිවී තිබුණා. ඒ වනතුරුත් නදුනි ආදරයෙන් රැකබලා ගත් සුනඛ ජෝඩුව සහ පැටවුන් කිහිප දෙනෙක් නදුනිගේ දේහය අසල තනි රකිමින් සිට තිබුණා. නදුනිගේ මළ සිරුර පරීක්ෂා කළ පොලිසිය සැක කළේ ලක්මාල් විසින් නදුනිගේ ගෙලට පහර කිහිපයක් එල්ල කොට ඇයව ඝාතනය කර පලාගොස් ඇති බවටයි. ඒ අනුව සැකකාර ලක්මාල් සොයා පොලිස් මෙහෙයුම් ක්‍රියාත්මක වූ අතර, දෙනුවන්ද කැඳවා පොලිසිය ප්‍රශ්න කරන්නට වුණා. එම ප්‍රශ්න කිරීම් හමුවේ දෙනුවන් පවසා ඇත්තේ නදුනි තමන් රවටා තම බැංකු ගිණුමෙන් රුපියල් ලක්ෂ 8කට ආසන්න මුදලක් වංචා කර ඇති බවයි. පසුව දෙනුවන් නදුනිගේ සුනඛ ජෝඩුව සහ පැටවුන් රැගෙන ගොස් තිබුණේ නදුනිට තිබූ ආදරය නිසාවෙනි.

දෙනුවන් පොලිසිය හමුවේ තවදුරටත් පවසා ඇත්තේ මෙවැන්නකි.

'තවත් කොල්ලෙක් එක්ක නදුනි සම්බන්ධයක් පවත්වාගෙන යන බව මම දැනගෙන හිටියේ නැහැ. මට නදුනි ගැන සැකයක් ඇතිවුණේ නැහැ. මම මෙයාව බඳින්න හිටියේ. පහුගිය කාලේ ලක්ෂ 10ක් විතර ඉල්ලගෙන තිබුණා. මම එයා ඉල්ලන ඉල්ලන සැරේට සල්ලි දුන්නා. නදුනි සත්තුන්ට ආදරේ කළා. ඒ සත්තුන්ට කන්න දුන්නෙත් මම. මම නදුනිට හදවතින්ම ආදරේ කළා. මම නදුනිට ආදරේ කළ නිසා බල්ලන් පස්දෙනාව මගේ ගෙදරට අරන් ගියා...'

පසුව දැනගන්නට ලැබුණේ ලක්මාල් නමැති සැකකරු නදුනි ඝාතනය කිරීමෙන් පසු දුම්රියට පැන ජීවිතය හානි කරගැනීමට උත්සාහ කර ඇති බවයි. දුම්රියට පැනීම නිසා බරපතළ තුවාල ලත් ඔහුව අවට සිටි පිරිස් විසින් කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර තිබූ අතර, මේ වනවිටත් ඔහු එහි ප්‍රතිකාර ලබමින් සිටියි.

ලක්මාල් පොලිස් ප්‍රශ්න කිරීම් හමුවේ පවසා තිබුණේ මෙවැන්නකි.

'මම හෝටලයේ වැඩ ඉවර වෙලා එනකොට ටිකක් රෑ වුණා. පාරේ බස් තිබුණේ නැති නිසා හෝටලයේ ඉඳලා ගෙදරට ආවේ පයින්මයි. කිලෝමීටර් 4කට වැඩි දුරක් තියෙනවා. මම හොඳටම හෙම්බත් වෙලා හිටියේ. ඇඟපත හෝදගෙන පුටුවක හාන්සි වෙලා හිටියා. කොච්චර මං නදුනිට සල්ලි දුන්නත් ඇතිවීමක් නැහැ. මං පුටුවේ හාන්සි වෙලා ඉන්නකොට නදුනි ඇවිත් සල්ලි ඉල්ලුවා. මං කිව්වා මං ළඟ සල්ලි නැහැ තාම පඩි හම්බවුණේ නැහැ කියලා. ඒ වෙනකොට නදුනිට මං ලක්ෂ 8ක් විතර දීලයි තිබුණේ. මං සල්ලි නැහැ කිව්ව ගමන් නදුනි මට අපහස කරලා බණින්න ගත්තා. සල්ලි දුන්නේ නැත්තම් මං පලිය ගන්නේ උඹේ නංගිගෙන් මගේ කොල්ලෝ දාලා. සල්ලි දෙන්න බැරිනම් ගෙදරින් පලයන්. ආයෙ පැත්ත පළාතක එන්න එපා...' කියලා කිව්වා. සුන්දර පෙනුමක් තිබුණට නදුනි හරි නපුරුයි...'

නදුනි මුදල් වංචා කළ පුවත ප්‍රචාරය වීමත් සමග තවත් ආගන්තුක තරුණයෙක් පොලිස් ස්ථානාධිපති සරත්චන්ද්‍ර මහතාට දුරකතන ඇමතුමක් ලබාදී මෙසේ පවසා තිබුණා.

'සර් මං මොරටුව පැත්තේ රස්සාවක් කරන කාලේ නදුනිත් එක්ක ප්‍රේම සම්බන්ධතාවක් පවත්වාගෙන ගියා. අපි දෙන්නා විවාහ වෙන්න හිටියේ. ඇය පෞද්ගලික විශ්වවිද්‍යාලයක නීතිය හදාරමින් හිටියේ. 2024 වර්ෂයේ නීති පීඨයට බැඳෙන්න ඕනේ කියලා මගෙන් වරින් වර සල්ලි ඉල්ලා ගත්තා. ලක්ෂ 10ක් විතර දුන්නා. මං බඳින්න ඉන්න නිසා ඇය ඉල්ලන ඉල්ලන වාරයක් පසා මුදල් ලබාදුන්නා. එයා ඊට පස්සේ මාව මගහැරලා ගියා...'

නදුනිගේ පියා මීට කලකට පෙර මියගොස් ඇති අතර, මව වැල්ලවත්ත ප්‍රදේශයේ ජීවත්වන බවද දැනගන්නට ලැබුණා. පසුගිය 09 වැනිදා නදුනිගේ මරණය සම්බන්ධ පශ්චාත් මරණ පරීක්ෂණය පානදුර රෝහලේදී සිදුකෙරුණු අතර, එහිදී දැනගන්නට ලැබුණේ පිහි පහර 10කට වඩා ඇගේ ශරීරයට එල්ල වී ඇති බවයි.

නදුනි විවාහ පොරොන්දු දී තරුණයන් මුළාකර ඔවුන්ගෙන් විශාල වශයෙන් මුදල් ලබාගෙන ඇති බව පොලිසිය අනාවරණ කරගෙන තිබුණා.

මේ සිදුවීම තුළ තිබෙන්නේත් පසුගිය කාලයේ රටම කැලඹූ තෙල්දෙණියේ හෞත චිකිත්සකවරියගේ ඝාතන සිද්ධියට සමාන කතාවකි. එම හෞත චිකිත්සකවරිය සමග පෙම් සබඳතාවක් පවත්වාගෙන ගිය තරුණයා කලක සිට මුදල් වංචා කර ඇයව ඝාතනය කර තිබුණා. නදුනි ඝාතනයද ඊට තරමක් සමාන වන්නේ නදුනි විසින් පෙම්වතුන් රවටා ඔවුන්ගේ මුදල් වංචා කර තිබීම හේතුවෙනි.

මේ තරුණිය සැබැවින්ම මේ තරුණයන්ටද ආදරය කළාද? නැතහොත් විවාහ පොරොන්දු මත මුදල් ලබාගත්තාද? එය තවමත් නොවිසඳුණු ප්‍රශ්නයකි. මෙම සිදුවීම අපට පෙන්වා දෙන්නේ ආදරය සහ මුදල් එකට මිශ්‍ර වූ විට ඇතිවිය හැකි භයානක තත්ත්වයයි. ආදරය යැයි සිතා දුන් මුදල් වංචාවක් බවට පත්වූ විට මිනිසකුගේ ආවේගය කොතැනින් නතර වේද? ආදරය ලෙස අපි හඳුනාගන්නා සෑම දෙයක්ම ආදරයද? ඒ ගැන නැවත නැවතත් හොඳින් සිතා බැලිය යුතු බව අපට මේ සිදුවීම විසින් මතක් කර දෙනවා.





නිලන්ති රේණුකා

## 10 වැනි C Rugby සැණකෙළිය CR&FC පිටියේදී




ක්‍රීඩා ලෝලීන් මහත් උනන්දුවෙන් මග බලා සිටි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ටැග් රග්බි (Tag Rugby) ක්‍රීඩා තරගාවලිය වන C Rugby තරගාවලිය, සිය 10 වැනි අභිමානවත් සංවත්සරය සනිටුහන් කරමින් මෙවරත් පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත. ඒ අනුව මෙම සුවිශේෂ ක්‍රීඩා සැණකෙළිය එළඹෙන ජූලි 17 සහ 18 යන දෙදින පුරා කොළඹ CR&FC ක්‍රීඩාංගණයේදී උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. ආදි ශිෂ්‍යයන්ගේ සුහද හමුවක් ලෙස ඇරඹි මෙම තරගාවලිය, අද වනවිට සුවිශේෂ ක්‍රීඩා සංස්කෘතියක් බවට පත්ව තිබේ. මෙවර තරගාවලියේ සුවිශේෂ වෙනසක් සනිටුහන් කරමින් ආයතනික අංශයේ තරග සහ ප්‍රදර්ශන තරග හඳුන්වා දෙනු ලබයි. ඒ අනුව පාසල් මෙන්ම ආයතනික අංශ නියෝජනය කරමින් කණ්ඩායම් 16ක් මෙවර තරග බිමට පිවිසීමට නියමිතය. ක්‍රීඩාව සහ සහෝදරත්වය පෙරදැරි කරගත් මෙම සුවිශේෂ තරග රටාව, ක්‍රීඩා ලෝලීන්ට නවතම අත්දැකීමක් වනු නොඅනුමානය.

මෙම සුවිශේෂ ටැග් රග්බි තරගාවලිය සංවිධාන කරනු ලබන්නේ ප්‍රවීණ රග්බි ක්‍රීඩක සහ ජාත්‍යන්තර විනිසුරු ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා (හිටපු ඉසිපතන, CR&FC සහ ජාතික ක්‍රීඩක) ප්‍රමුඛ AGOAL International ආයතනය විසිනි. මෙවර තරගාවලිය වඩාත් උත්කර්ෂවත් කිරීම සඳහා Cinnamon Hotels, Iodex, Red Bull, Frosty, CR&FC සහ YES 101 ආයතන නිල සහකරුවන් ලෙස එක්ව සිටියි.

ප්‍රියන්ත හෙට්ටිගේ

## සුසමය විදු මවට වසර 125 යි ආශීර්වාද පතා පිරිත් පින්කමක්

ගුණ නැණ පිරි වැඩදායී පුරවැසියන් රැසක් දැයට දායාද කළ බොරැල්ල සුසමයවර්ධන විද්‍යාලයට අභිමානවත් 125 වසරක් පිරීම නිමිත්තෙන් වර්තමාන විදුහල්පති සුජීව රොෂාන් ධර්මප්‍රිය මහතාගේත් නියෝජ්‍ය විදුහල්පතිනී කුමුදු ලියනආරච්චි මහත්මියගේත් මූලිකත්වයෙන් ආදි සිසුන්, ආදිගුරුවරුන්, වර්තමාන ගුරුභවතුන්, වර්තමාන සිසුන්, මවුපියන් හා ධන පරිත්‍යාගශීලීන්ගේ අනුග්‍රහයෙන් 2026.07.24 දින ප.ව.4.00ට අලංකාර පෙරහැරකින් ස්වාමීන් වහන්සේලා වැඩම කරවා විද්‍යාලයීය පරිශ්‍රයේදී පිරිත් දේශනාමය පින්කම පැවැත්වීමට හා පසු දින දහවල් දානමය පින්කමක් පැවැත්වීමට කටයුතු සංවිධාන කර ඇත.

PAGE - 01

## පළාත් සභා ඡන්දය...

දින නියමයක් නොමැතිව වත්මන් ආණ්ඩුව විසින් කල්දමා ඇති පළාත් සභා මැතිවරණය වහාම පවත්වන ලෙස ඉල්ලා උතුරු නැගෙනහිර සහ වතුකරයේ දෙමළ, මුස්ලිම් පක්ෂ සියල්ල ඒකාබද්ධව නව සටනක් ආරම්භ කිරීමට තීරණය කොට තිබේ.

එහි පළමු පියවර වශයෙන් පසුගියදා දේශපාලන පක්ෂ 6ක නියෝජිතයන් කොළඹදී මාධ්‍ය හමුවක් කැඳවා මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට පියවර ගෙන තිබිණි.

මෙම මාධ්‍ය හමුවට ඉලංගෙයි තමිල් අරසු කච්චි, දෙමළ ප්‍රගතිශීලී සන්ධානය, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, සමස්ත ලංකා මහජන කොංග්‍රසය, ප්‍රජාතන්ත්‍රවාදී දෙමළ ජාතික සන්ධානය සහ ලංකා කම්කරු කොංග්‍රසය යන පක්ෂවල නායකයින් සහ නියෝජිතයින් පිරිසක් මෙම මාධ්‍ය හමුවට එක්ව සිටියහ. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ නායකත්වයෙන් යුත් සමගි ජන බලවේගයේ සමගි ජන සන්ධානය නියෝජනය කරන ප්‍රධාන පක්ෂ වන දෙමළ ප්‍රගතිශීලී සන්ධානයේ නායක මනෝ ගනේෂන්, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක රවුෆ් හකීම් සහ සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ නායක රිෂාඩ් බදියුදීන්ද මෙම මාධ්‍ය හමුවට එක්ව සිටීම විශේෂත්වයක් විය.

තවද එක්සත් ජාතික පක්ෂයෙන් මෙවර පාර්ලිමේන්තුවට තේරී පත්වූ ලංකා කම්කරු කොංග්‍රසයේ මහලේකම් ජීවන් තොණ්ඩමාන් ද මෙම මාධ්‍ය හමුවට එක්ව සිටියේය.

මෙහිදී ආණ්ඩුව දෙමළ මුස්ලිම් ජනතාවට පොරොන්දු වූ පරිදි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීම, පළාත් සභා මැතිවරණය පැවැත්වීම සහ උතුරු නැගෙනහිර මෙන්ම වතුකරයේ ඉඩම් ප්‍රශ්න විසඳීම යන කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුවට බලකිරීම මෙම සන්ධානය බිහිකිරීමේ ප්‍රධාන අරමුණු අතර වන බවද දැනගන්නට තිබේ.

## සජිත් මුළු විපක්ෂයම...

සඳහා මෙසේ විපක්ෂ නායකවරයා විසින් විපක්ෂයේ සියලු පක්ෂ කොළඹට කැඳවීමට පියවර ගෙන ඇති බව පැවසේ.

ඒ අනුව පසුගිය සතියේදී විපක්ෂ නායකවරයා විපක්ෂයේ සියලු පක්ෂ නායකයන් වෙත දුරකතන ඇමතුම් ලබාදෙමින් මෙම ආරාධනාව සිදුකිරීමට කටයුතු කොට ඇති බව දැනගන්නට තිබේ.

ඊට සියලු පක්ෂ නායකයන්ගේ යහපත් ප්‍රතිචාරයක් ලැබී ඇති බවක්ද දැනගන්නට ඇත.

ආණ්ඩුවේ මෙම උත්සාහයට එරෙහිව දැනටමත් අධිකරණ සේවා සංගමය, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ආසියානු නීතිඥ සංගමය සහ පොදුරාජ්‍ය මණ්ඩලයීය නීතිඥ සංගමයද සිය විරෝධය පළකිරීමට කටයුතු කොට තිබේ.

## මාලිමාව රට පුරා...

පසුගිය කාලවකවානුවේ ආණ්ඩුව සිදුකළ වැඩ සම්බන්ධයෙන් සහ ඉදිරියේදී සිදුකිරීමට නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කරමින් මුළු රටම ආවරණය වන පරිදි දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ආණ්ඩුව සැලසුම් කර තිබේ.

පසුගිය සතියේ ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ජවිපෙ සහ මාලිමා නියෝජිතයන් අතර පැවැති සාකච්ඡාවකදී මෙම තීන්දුව ගෙන ඇති බව දැනගන්නට ඇත. ඒ අනුව, දිස්ත්‍රික් මට්ටමින් දැවැන්ත දේශපාලන රැලි සංවිධාන කිරීමත්, නිවසක් නිවසක් පාසා යමින් ආණ්ඩුවේ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමටත් තීන්දු වී ඇති බව පැවැසේ.

එහිදී දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන දේශපාලන රැලි සඳහා ජනාධිපතිවරයා මෙන්ම ජවිපෙ සහ මාලිමාවේ ප්‍රධානීන් සහභාගි වීමට නියමිතව ඇති බවද වාර්තා වේ.

එමෙන්ම මාස දෙක තුනක කාලයක් අඛණ්ඩව මෙම ප්‍රචාරක වැඩපිළිවෙළ රට පුරා දියත් කිරීමටද ආණ්ඩුව තීන්දු කොට ඇති බවක් දැනගන්නට ඇත.

## ආර්ථිකය 51.4%කින්...

වසරකට පෙර පැවැති තත්ත්වය හා සැසඳීමේදී ශ්‍රී ලංකාවේ ගෘහස්ත ආර්ථික තත්ත්වය නරක අතට හැරී ඇති බව ඒ සම්බන්ධයෙන් සිදුකර ඇති නවතම සමීක්ෂණයකින් අනාවරණ කොට තිබේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් පසුගියදා සිදුකරනු ලැබූ මත විමසුමකදී 51.4%ක ප්‍රමාණයක් පෙන්වා දී ඇත්තේ වසරකට පෙර පැවැති තත්ත්වය හා සැසඳීමේදී ගෘහස්ත ආර්ථික තත්ත්වය නරක අතට හැරී ඇති බවකි.

කෙසේ වෙතත් එම මත විමසීමේදී 18.2%ක ප්‍රමාණයක් පමණක් ගෘහස්ත ආර්ථික තත්ත්වය හොඳ අතට හැරී ඇති බවට පිළිගෙන ඇති අතර, 30.3%ක ප්‍රමාණයක් ගෘහස්ත ආර්ථික තත්ත්වය පෙර තිබූ පරිදිම පවතින බව සඳහන් කොට තිබේ.

## කෝච්චි බස් ගැන

එළැඹෙන 2027 වර්ෂයේ අයවැයේදී ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දැවැන්ත මුදල් ප්‍රමාණයක් වෙන්කිරීමට ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා තීරණය කොට ඇත.

ඒ අනුව 2027 වසරේදී රටේ පවතින ප්‍රවාහන ක්ෂේත්‍රය පූර්ණ ප්‍රතිසංවිධානයකට ලක්කිරීමට ජනාධිපතිවරයා තීන්දු කොට ඇති බව දැනගන්නට තිබේ.

එහිදී දැනට මගී ප්‍රවාහනයේදී පොදු ජනතාවට සේවා සපයන සාමාන්‍ය බස් රථ වෙනුවට සුඛෝපභෝගී මෙට්‍රෝ බස් රථ ධාවනයට එක්කොට, ක්‍රමක්‍රමයෙන් සාමාන්‍ය බස් රථ සම්පූර්ණයෙන්ම ධාවනයෙන් ඉවත් කිරීමට ජනාධිපතිවරයාගේ අවධානය යොමුව ඇති බවක් දැනගන්නට ඇත.

මීට අමතරව කාර්යාල සේවකයන් විශාල වශයෙන් පැමිණෙන කොටුව - කොට්ටාව, කොටුව - රාගම සහ කොටුව - පානදුර යන දුම්රිය මාර්ගයන් මුල්කරගෙන විදුලි දුම්රිය සේවාවක් 2027 වර්ෂයේ ආරම්භ කිරීමටද ජනාධිපතිවරයා තීරණය කොට ඇති බව වාර්තා වේ.

## ඩෙංගු රෝගීන් ලක්ෂයක්...

වසරේ ගතවූ කාලය තුළ ඩෙංගු මරණ 50ක් වාර්තා වී ඇති බව ජාතික ඩෙංගු මර්දන ඒකකය සඳහන් කරයි.

පසුගිය සිකුරාදා (16) වනවිට එම ඒකකය මගින් නිකුත් කළ නවතම වාර්තාවේ සඳහන්ව ඇත්තේ අදාළ කාලය තුළ වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 73,000 ඉක්මවා ඇති බවකි.

ඒ අනුව සිකුරාදා වනවිට වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 73,455කි.

සිකුරාදා දිනට පමණක් රෝගීන් 1,025ක් වාර්තා වී ඇති අතර, ඉන් වැඩිම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බස්නාහිර පළාතෙනි. එම රෝගීන් සංඛ්‍යාව 38,700කි. එමෙන්ම බස්නාහිර පළාතේ වැඩිම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් වන අතර එම රෝගීන් සංඛ්‍යාව 15,341කි.

එමෙන්ම කොළඹ දිස්ත්‍රික්කයෙන් රෝගීන් 14,625ක්ද වාර්තා වී ඇති බව ඩෙංගු මර්දන ඒකකය සඳහන් කරයි.

## මහා සංඝරත්නය කොළඹට...

සම්බුද්ධ ශාසනයට සිදුකරන කෙනෙහිලිකම්වලට එරෙහිව ලබන ජූලි 27 වැනිදා කොළඹදී මහා සඟ සමුළුවක් පැවැත්වීමට යෝජනා වී තිබේ.

මහාචාර්ය පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි, මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි, මහාචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස යන හිමිවරුන්ගේ ප්‍රධානත්වයෙන් මෙම මහා සඟ සමුළුව පැවැත්වීමට නියමිත බව දැනගන්නට තිබේ.

ශ්‍රී ලාංකේය මහාවිහාර වංශික ථේරවාද භික්ෂූන් වහන්සේ සහිත ශ්‍රී ලංකා සම්බුද්ධ ශාසනයට එරෙහිව අපහාස කිරීම, අවතක්සේරු කිරීම, අවමන් කිරීම, අලාභහානි කිරීම, කායික හා වාචසික හිංසනය කිරීම් මගින් මෙම එදිරිවාදිකම්වලට එරෙහිව මෙම සමුළුව පැවැත්වීමට නියමිත බව වාර්තා වේ.

ඊට ත්‍රෛනිකායික මහානාහිමිවරුන්ටද ආරාධනා කිරීමට තීරණය කොට ඇති බව දැනගන්නට ඇත.

## 29 තරගයෙන් අවුට්...

දෙදෙනා බවට ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාත්, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාත් පත්ව ඇති බවකි. ඒ අනුව, අනෙකුත් දේශපාලන නායකයන් වන රනිල් වික්‍රමසිංහ, දිලිත් ජයවීර සහ නාමල් රාජපක්ෂ මේ වනවිට අවම ජනප්‍රසාදයක් සහිත දේශපාලනඥයන් බවට පත්ව ඇති බවද එම සමීක්ෂණය මගින් අනාවරණ කර තිබේ.

## එල් - නිනෝ දරුණු වෙයි

මෙම වසරේ නොවැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා එල් නිනෝ තත්ත්වය ඉතා ප්‍රබල වීමට නියමිත බවත්, එහි සම්භාවිතාව 81%ක් බවත්, මේ අනුව එම කාලයේදී මෙරටට තද වැසි ඇතිවීමේ හැකියාව වැඩි බවත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (අනාවැකි) මෙරිල් මෙන්ඩිස් පැවැසීය.

ඇමෙරිකානු ජාතික සාගර හා වායුගෝලීය පරිපාලන ආයතනයේ දත්ත අනුව එල් - නිනෝ තත්ත්වය ඉතා ප්‍රබල මට්ටමකට නොපැමිණීමේ හැකියාව තුනෙන් එකක් බවද ඒ මහතා පෙන්වා දුන්නේය.

මේ අතර ජලාශවල පවතින ජලය අරපිරිමැස්මෙන් භාවිත කරන්නේ නම් ඉදිරි යල කන්නයේ වගා කටයුතු සඳහා වාරි ජලය සපයා ගැනීම සම්බන්ධව ගැටලුවක් මතු නොවනු ඇතැයිද අධ්‍යක්ෂවරයා කියා සිටියේය.


HUTCH
ගෞරවාභිමාන
HUTCH
HUTCH
කහවණු උදානය
අපි දිනන මිනිස්සු
සීමාවන් අතික්‍රමණය කරමින් ජනතාව වෙනුවෙන්
අසමසමව කැපවෙන, අපගේ විශිෂ්ටතම
වෙළඳ පාර්ශවකරුවන්ව අභිමානයෙන් අගයන
විජයග්‍රාහී ස්වර්ණ මෞලි මංගල්‍යය
HUTCH
කහවණු උදානය
+10,000
අලෙවි නියෝජිතයින්
එක් වටිනා ජයග්‍රහනයක් - එකම අරමුණක්!
රුපියල්
මිලියන 200 අධික ත්‍යාග
වටිනාකමෙන් විශාලම ත්‍යාග මංගල්‍යය!
දිවයින පුරා
ප්‍රජාවන් සම්බන්ධ කරන
අපගේ විශ්වාසනීය හවුල්කරුවන් ඇගයීම
රුපියල් මිලියන 2ක සුපිරි මුදල් ත්‍යාගය
ජයග්‍රහනය කල වෙළඳ මහතා
2 Million Cash Winner
MILLIONAIRE
Rs. 2,000,000
HUTCH
රුපියල් මිලියනයේ ත්‍යාග ජයග්‍රහනය කල වෙළඳ මහතුන්
1 Million Cash Winner
MILLIONAIRE
Rs. 1,000,000
HUTCH
යතුරුපැදි සහ විදුලි යතුරුපැදි (EV Bikes) ජයග්‍රහනය කල වෙළඳ මහතුන්
Discovery 125 Motor Bike Winner
Electric Scooter Winner
CT-100 Motor Bike Winner
HUTCH
අනෙකුත් ත්‍යාග ජයග්‍රහනය කල වෙළඳ මහතුන්
Electronic Cash Register
PHOTOCOPY MACHINE WINNER
Reload Machine Winner
RELOAD MACHINE
රන් කාසි ජයග්‍රහනය කල වෙළඳ නියෝජිතයන්

මව්රට

ලිපිනය
නො: 22, ජයරත්න මාවත, කොළඹ 05

කර්තෘ මණ්ඩලය
0112505134

ඊමේල්
news@mawratanews.lk

වෙබ් අඩවිය
www.mawratanews.lk

බෙදාහැරීම්
0764 449 688

දැන්වීම්
0114870063

උපුල් ජෝශප් ප්‍රනාන්දුගේ
# ගුරුද්‍ය විග්‍රහය

# වමටද බර?

**රනිල් ජනාධිපති වී අයි.එම්.එෆ්. පළමු වාරිකය අනුමත කරගන්න දඟලද්දී ඇමෙරිකානු සී.අයි.ඒ. ඔත්තු සේවයේ ලොක්කා හොර රහසේ ලංකාවට ආවේය. රනිල් ඔහු හමුවීමෙන් පසු බුද්ධි අංශවලට ලංකාවේ තත්ත්වය ගැන සී.අයි.ඒ. ලොක්කාට පැහැදිලි කිරීමක් කරන ලෙස කීවේය. ඉදිරි ජාතික මැතිවරණයකදී වාමවාදී පක්ෂයක් වන ජවිපෙ බලයට ඒමට තිබෙන අවස්ථාව බුද්ධි අංශ ප්‍රධානීන් පැහැදිලි කළේය. බුද්ධි අංශ ප්‍රධානීන් එය පැහැදිලි කළේ රනිල්ගේ වුවමනාවට විය යුතුය. රනිල් හිතන්න ඇත්තේ ජවිපෙ බලයට එනවා කියා සී.අයි.ඒ. ලොක්කාව බය කළාම ඇමෙරිකාව රනිල්ව දිනවන්න උදව් කරයි කියා විය යුතුය.**

'විජේවීර සී.අයි.ඒ.කාරයෙක්...'

1970 දශකයේ කොමියුනිස්ට් පක්ෂයේ නිල පුවත්පත වන 'ඇත්ත' පත්තරය මේ හෙඩ් ලයින් එක පළකරන විට රනිල් ජේ.ආර්.ගේ ආණ්ඩුවේ නියෝජ්‍ය විදේශ ඇමැතිය.

කොමියුනිස්ට් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය විජේවීර සී.අයි.ඒ.කාරයෙක් කියලා කිව්වේ 1971 කැරැල්ල ගහපු වෙලාවේය. ඔවුන් කීවේ ලංකාවේ පළමුවරට මහජන ඡන්දයෙන් තේරී පත්වූ වාමාංශික සන්ධාන ආණ්ඩුව වට්ටවන්න විජේවීර කැරැල්ලක් ගැහුවේ සී.අයි.ඒ. වුවමනාවට කියාය.

1987 ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව විජේවීර කැරැල්ලක් ගහන වෙලාවේත් ලංකා සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය පමණක් නොව විජය කුමාරතුංගගේ මහජන පක්ෂයත් කීවේ සෝවියට් හිතවාදී ඉන්දියාවේ මැදිහත් වීම සී.අයි.ඒ. නොඉවසන බවත්, ගිවිසුම කඩාකප්පල් කිරීමේ කොන්ත්‍රාත්තුව සී.අයි.ඒ. විජේවීරට භාරදී ඇති බවත්ය.

මෙහි ඇත්ත නැත්ත කුමක් වුවද විජේවීර පෙනී සිටියේ ඇමෙරිකානු අධිරාජ්‍යවාදයට එරෙහිවය. විජේවීර 1971 කැරැල්ලට තරුණ තරුණියන් ආකර්ෂණය කරගත්තේ චේගුවේරාව පෙන්නලාය. එකල ජවිපෙ වීරයා වූයේ චේගුවේරාය.

විජේවීර හිරෙන් නිදහස් වී ඇවිත් දෙවැනි විප්ලවයට තරුණ තරුණියන් ආකර්ෂණය කරගන්න පාවිච්චි කළේ ඉරානයේ ආධ්‍යාත්මික නායක අයතුල්ලා කොමෙයිනිවය. ඇමෙරිකානු රූකඩ ආණ්ඩුවක් වූ ෂාගේ ආණ්ඩුවට එරෙහිව කොමෙයිනි දියත් කළ විප්ලවය පත්නයේ

> **'මෙහි ඇත්ත නැත්ත කුමක් වුවද විජේවීර පෙනී සිටියේ ඇමෙරිකානු අධිරාජ්‍යවාදයට එරෙහිවය. විජේවීර 1971 කැරැල්ලට තරුණ තරුණියන් ආකර්ෂණය කරගත්තේ චේගුවේරාව පෙන්නලාය. එකල ජවිපෙ වීරයා වූයේ චේගුවේරාය.**







## ඇමෙරිකාව රනිල්ව අතහැරියේ ඇයි?

විප්ලවයක් ගැන විජේවීර සිය දේශනවලදී කතා කළේය.

විජේවීරගේ ඒ විප්ලව සාර්ථක නොවුණත් අද ලංකාව ආණ්ඩු කරන්නේ ජවිපෙය. පසුගියදා ඇමෙරිකානු සහ ඊශ්‍රායල ප්‍රහාරවලින් ඉරානයේ දෙවැනි ආධ්‍යාත්මික නායක අලි කොමෙයිනි ඝාතනය විය. ඔහුගේ අවමඟුල පසුගියදා මහ ඉහළින් පැවැත්විණි. ඒ අවමඟුලට ලංකාවේ ජේ.වී.පී. ආණ්ඩුව නියෝජනය කළේ නියෝජ්‍ය කතානායකවරයාය.

පසුගියදා කටාරයේ එමීර්වරයා මරණයට පත්විය. කටාරය මැදපෙරදිග ඇමෙරිකානු පක්ෂපාතී රටක් ලෙස ප්‍රකටය. එමීර්වරයාගේ අවමඟුලට සහභාගි වෙන්න ලංකාවෙන් ගියේ අගමැතිනි හරිනිය.

'ජවිපෙ ඒ තරමට ඇමෙරිකාවට බයද...?'

බයවෙන්න හේතුවක් නැත. ලංකාවේ ඇමෙරිකානු තානාපතිවරයෙක් නොසිටි දීර්ඝතම කාලය මේ කාලයය. ඒත් ලංකාවට ප්‍රශ්නයකුත් නැත. ඇමෙරිකාවට ප්‍රශ්නයකුත් නැත. හේතුව දැන් ඇමෙරිකාවට ලංකාව ගැන බයවෙන්න දෙයක් නැත.

'ඒ කියන්නේ ඇමෙරිකාව ජේ.වී.පී. ආණ්ඩුවට කැමැතිද..?'

ඇමෙරිකාව ලංකාව ගැන ඇහැ ගහගෙන සිටියේ රාජපක්ෂලා ලංකාව ආණ්ඩු කරද්දීය. එයට ප්‍රධානතම හේතුව රාජපක්ෂලා චීනයට පක්ෂපාතී වීමත් ජාත්‍යන්තර භූ දේශපාලනයේ ඇමෙරිකානු විරෝධී සන්ධානයේ හවුල්කරුවකු වීමත් නිසාය. ඇමෙරිකාව මෙය ඉවසුවේ නැත. 2015 තමාව පරාජයට පත්කළේ විදේශ බලවේග යැයි මහින්ද ප්‍රසිද්ධියේ කීවේ ඒ නිසාය.

2015 මහින්දව පරාජය කරන්න ඇමෙරිකාවට ලොකු වුවමනාවක් තිබුණේය. එහිදී ඇමෙරිකාවට ලොකුම බාධාව වුණේ රනිල්ය. හේතුව රනිල්ට දිනන්න බැරිවීමත් ඇමෙරිකා හිතවාදී යූ.ඇන්.පී.ය රනිල් විනාශ කර තිබීමත් නිසාය. ඒ වෙලාවේ ඇමෙරිකාවේ පිහිටට ආවේ ජවිපෙය. රාජපක්ෂවරු පරාජය කරන්න 2015 ජවිපෙ විශාල වැඩකොටසක් කළේ අපේක්ෂකයකු ඉදිරිපත් නොකරමින් ලංකාව වටේ වේදිකාවක් වේදිකාවක් ගානේ ගිහින් රාජපක්ෂලාව පතුරු ගහන ගමන් වහෙන් ඔරෝ භාෂාවෙන් විපක්ෂයේ පොදු අපේක්ෂකයා මෛත්‍රීව දිනවීමෙනි.

'ඉතින් ඇමෙරිකාව 2024 ජවිපෙට සෙට් වීම පුදුමයක්ද...?'

> **'දැන් ට්‍රම්ප් ලංකාව සහ ඉන්දියාව ඇතුළු දකුණු ආසියාව ගැන බලන්න එවලා තියෙන ඉන්දියාවේ ඇමෙරිකානු තානාපති ට්‍රම්ප්ගේ විශේෂ දූතයා සර්ජියෝ අනුරගේ මිත්‍රයාය. සර්ජියෝ ලංකාවට ඇවිත් කොළඹ වරාය වටේ රවුමක් ගිහින් දොඹකරවලට නැගලා වරාය තුළින් ඉන්දියානු සාගරය නිරීක්ෂණය කළේ ලංකාව ඇමෙරිකාවට අත්‍යාවශ්‍යම ආරක්ෂක මර්මස්ථානයක් බව දැනගෙනය.**

නැත. ඇත්තටම ජවිපෙ සහ ඇමෙරිකාව අතර පාලම හැදුවේ මංගලය. 2015 ජනාධිපතිවරණයට අපේක්ෂකයකු නොදමන්න ජවිපෙ එකඟ කරවාගත්තේ මංගලය.

අනුර ජනාධිපති වීමෙන් පසු ඇමෙරිකාව අනුර ගැන ටෙස්ට් එකක් කළේය. ඒ අනුර චීන පර්යේෂණ නැව්වලට ලංකාවට ඇතුළු වීමට රනිල් පනවා තිබූ තහනම ඉවත් කරනවාද නැද්ද යන්නය. චීනය කොයි තරම් බලපෑම් කළත් අනුර ඒ තහනම ඉවත් කළේ නැත. අනුර ටෙස්ට් එකෙන් පාස් විය.

ඊළඟ ටෙස්ට් එක කළේ ඉරාන යුද්ධයේදීය. අනුරගේ ආණ්ඩුව ඉරානයට එල්ල කළ පහරදීම් හෙළාදැක්කේ නැත. දෙවැනි ටෙස්ට් එකත් පාස් විය.

දැන් ට්‍රම්ප් ලංකාව සහ ඉන්දියාව ඇතුළු දකුණු ආසියාව ගැන බලන්න එවලා තියෙන ඉන්දියාවේ ඇමෙරිකානු තානාපති ට්‍රම්ප්ගේ විශේෂ දූතයා සර්ජියෝ අනුරගේ මිත්‍රයාය. සර්ජියෝ ලංකාවට ඇවිත් කොළඹ වරාය වටේ රවුමක් ගිහින් දොඹකරවලට නැගලා වරාය තුළින් ඉන්දියානු සාගරය නිරීක්ෂණය කළේ ලංකාව ඇමෙරිකාවට අත්‍යාවශ්‍යම ආරක්ෂක මර්මස්ථානයක් බව දැනගෙනය.

'ලෝකයේ තෙල්වලින් 75%ක් යන්නේ ලංකාවේ දකුණු මුහුදු තීරයට ආසන්නයේ. ලෝකයේ කන්ටේනර්වලින් හරි අඩක් යන්නේ ලංකාවේ සී ලයින් එකෙන්. ලංකාව ලෝක ආර්ථිකයට වගේම ඇමෙරිකාවේ ආරක්ෂාවටත් වැදගත් මර්මස්ථානයක්...'

මේ, පසුගියදා ලංකාවට ආ ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ මධ්‍යම සහ දකුණු ආසියාව භාර සහකාර ලේකම් කපූර් ඇමෙරිකානු විදේශ සබඳතා සෙනට් කමිටුවට කී කතාවය.

ඇත්ත කතාව නම් ඇමෙරිකාවට ලංකාව ගැන රසය ඇතිවෙලා තියෙන්නේ ඉරාන යුද්ධයත් සමගය. කලින් ලංකාව ගැන උනන්දු වූයේ චීන සෙල්ලම් මට්ටු කරන්නටය. ඒත් දැන් මැදපෙරදිග යුද්ධයකදී ඇමෙරිකාව ලංකාව දකින්නේ ඉන්දීය සාගරයේ ආරක්ෂක සම්පතක් ලෙසය.

## ලංකාවේ මර්මස්ථානවලට ඇමෙරිකාව ඇහැ ගහයි

ඉතින් ඇමෙරිකාවට අනුරව තරහා කරගන්න ඕනෑ නැත. ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන, මානව හිමිකම් ගැන, මාධ්‍ය නිදහස ගැන දැන් ඇමෙරිකාවට වගේ වගක් නැත.

ඉතින් අනුර ඉරානයේ අවමඟුලට නියෝජ්‍ය කතානායක යවලා කටාර් අවමඟුලට හරිනි නොයවා ඉඳියිද?

**උපුල් ජෝශප් ප්‍රනාන්දු**



# හැට පැන්න වයසට නොයන දේශපාලකයන්ගෙ රහස මොකක් ද?

**ලංකාවේ දේශපාලනඥයන්ගේ සාමාන්‍යයෙන් වයස කීයද? මේ ගැන වෛද්‍ය චමල් සංජීව මරු කතාවක් කියලා තිබුණා. චමල් කියන්නේ ලංකාවේ දේශපාලනඥයෝ බහුතරය වයසට ගියත් හොඳ ෆිට් එකේ ඉන්නවා කියලා. මහින්දට දැන් වයස අවුරුදු 80යි. රනිල්ට අවුරුදු 77යි. මෛත්‍රීට දැන් අවුරුදු 74යි.**

ලංකාවේ තවත් දේශපාලනඥයෝ ගොඩදෙනෙක් ඉන්නවා. ලංකාවේ ප්‍රධාන ධාරාවේ ඉන්න දේශපාලනඥයන්ගෙන් පස් දෙනෙක්ම අවුරුදු 80 පැනලා. ගොඩක් අයට අවුරුදු 60ට 70ට වඩා වැඩියි. අවුරුදු 75 පහුකරපු අය පාර්ලිමේන්තු, පළාත් සභා නියෝජනය කරන දේශපාලනඥයන්ගෙන් 10%ක්. හැබැයි ඒගොල්ලෝ කොහොමද මේ ෆිට් එකේ ඉන්නේ? අන්න ඒක ගැන තමයි චමල් සංජීව හරි ලස්සන පැහැදිලි කිරීමක් කරලා තියෙන්නේ. ඒ අය කොච්චර වයසට ගියත් තමන්ගේ ෆිට්නස් තියාගෙන ඉන්නවා. ඒක මරු කතාවක්.

චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියත් ඔයාලට මතක ඇති නේද? එතුමිය ඉපදිලා තියෙන්නේ 1945. ඒ කියන්නේ දැන් චන්ද්‍රිකා බණ්ඩාරනායක නෝනාගේ වයස අවුරුදු 79ක්. එතකොට මේ හැමෝම ලොකුවට අබලන් වෙලා නැහැ. බොහොම ලස්සනට තමන්ව මේන්ටේන් කරගෙන ඉන්නවා කියන එක තමයි අපිට පැහැදිලි වෙලා තියෙන්නේ. ඒකට සාපේක්ෂව ලංකාවේ වෛද්‍යවරුන්ගේ වයස බොහොම නරක මට්ටමක තියෙනවා කියලා චමල් සංජීව මහත්මයා ඒ පැහැදිලි කිරීම ඇතුළෙම කියනවා. ලංකාවේ වෛද්‍යවරු ඉතා ඉක්මනින් මියයනවා. ඒගොල්ලන්ට වයස යනකන් ජීවත්වෙන්න ලැබෙන්නේ නැහැ. ඒගොල්ලොන්ට විවිධ රෝගාබාධ හැදෙන්න පුළුවන් කියලා කියනවා. මොකක්ද මේකට හේතුව? ලංකාවේ දේශපාලකයෝ සාමාන්‍ය පුද්ගලයන්ට නැති ඉහළ වරප්‍රසාද භුක්ති විඳිනවා. ඉතා ඉහළ සෞඛ්‍ය පහසුකම් ඒ අය විඳිනවා. ඒ අයට හොඳ රෝහල් පහසුකම් තියෙනවා. පොඩ්ඩක් අසනීප වෙච්ච ගමන් සිංගප්පූරුවේ ගිහිල්ලා ඒගොල්ලෝ බෙහෙත් ගන්නවා. ඒ වගේම ලංකාවේ වෛද්‍ය ක්ෂේත්‍රයේ ඉන්න අයට එහෙම සෞඛ්‍ය පහසුකම් තිබුණත් ඒගොල්ලෝ රෑට නිදි මරනවා. විශාල වශයෙන් වෙහෙස වෙනවා. රෝහල් රාජකාරීවලට අමතරව පෞද්ගලික රාජකාරී, පෞද්ගලික බෙහෙත් දීමේ වැඩකටයුතුවලට ඒගොල්ලෝ යොමු වෙනවා. සමහර අය ගෙදර යද්දි පාන්දර එකයි, සමහර වෙලාවට දෙකයි, සමහර වෙලාවට තුනයි. ඉතින් ඒ නිසා තමයි ඒගොල්ලොන්ට අපේ දේශපාලකයෝ වගේ ෆිට් එකේ ඉන්න බැරි.

මේ වයස්ගත දේශපාලකයන්ගේ බලයට පැමිණීමේ රැල්ල වෙනස් කරන්න පුළුවන් වුණේ ලංකාවේ බලයට ආපු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට විතරයි. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා එන්න කලින් හිටපු ගොඩක් දේශපාලකයෝ වයස්ගත කට්ටිය. ඒ වගේම ලංකාවේ මේ වෙලාවේ සජිත් ප්‍රේමදාස මහත්තයාත් ඒ හැටි වයසක කෙනෙක් නෙමෙයි. අනුර කුමාර මහත්තයා ගැන හරියටම කතා කළොත් ඔහු ඉපදිලා තියෙන්නේ 1968 නොවැම්බර් මාසේ 27 වැනිදා. ඒ කියන්නේ ඔහුට දැන් වයස අවුරුදු 57යි. අනුර කුමාර මහත්තයාට තව දේශපාලන ධාරාවේ ඉන්න ඕනෙ තරම් කල් තියෙනවා මේ රටේ දේශපාලනය හැසිරෙන විදිහ දිහා බැලුවාම.

සජිත් ප්‍රේමදාස මහත්තයා ඉපදිලා තියෙන්නේ 1967 ජනවාරි මාසේ 12 වැනිදා. ඔහුට දැන් වයස අවුරුදු 59යි. මේ දෙන්නාම වයස අවුරුදු 60ට අඩුයි. ඒ නිසා වයස අවුරුදු 60ට අඩු දේශපාලකයන්ට තව අවුරුදු 20ක් කිසි ප්‍රශ්නයක් නැතුව මේ දේශපාලන ධාරාවේ ඉන්න පුළුවන් කියන එක තමයි මේකෙන් පැහැදිලි වෙන්නේ. ඒ කියන්නේ අනුර කුමාර දිසානායක මහත්තයාට තවම එයාගේ දේශපාලන දිවිය ඉවර කරන්න හිතන්නවත් අවශ්‍යතාවක් නැහැ. හැබැයි මේ වයස වෙද්දි ලංකාවේ වෛද්‍යවරු බොහෝ දෙනෙක් අබලන්. ඒගොල්ලන්ගේ රාජකාරීවලින් ඒගොල්ලෝ විශ්‍රාම ගියාට පස්සේ ඒගොල්ලන්ගේ දරුවෝ එහෙම පිටරටවල. ඒගොල්ලන්ගේ වෙහෙස වැඩියි. ඒගොල්ලොන්ට තියෙන පිළිගැනීම නැත්තටම නැති වෙනවා. ඒගොල්ලෝ ජීවත්වෙන්නේ ගොඩක් වෙලාවට ප්‍රශ්නත් එක්ක, මිනිස්සුන්ගේ දුකත් එක්ක, මිනිස්සුන්ගේ වේදනාවලුත් එක්ක. අපි කොච්චර වෛද්‍යවරුන්ට බැන්නත් ඒගොල්ලෝ එක දිගට වැඩකරන අය, නිදි මරන අය. හැබැයි මේ කිසි දෙයක් ලංකාවේ දේශපාලකයන්ට අදාළ නැහැ. දේශපාලකයෝ එහෙම මහන්සි වෙන්නේ නැහැ. ඒගොල්ලෝ බොහොම ලස්සනට තමන්ගේ වැඩකටයුතු කරගෙන ඉන්නවා.

ඒගොල්ලන්ට ඉහළම සත්කාර ටික ලබාගන්න පුළුවන් වෙලා තියෙනවා. ලංකාවේ දේශපාලන ධාරාවේ ඉන්න වයස්ගතම දේශපාලකයෙක් විදිහට අපට සලකන්න පුළුවන් වෙන්නේ වාසුදේව නානායක්කාර මහත්තයා. වාසුදේව නානායක්කාර ඉපදිලා තියෙන්නේ 1939 කියලා තමයි දැනගන්න තියෙන්නේ. ඒ කියන්නේ දැන් ඔහුගේ වයස අවුරුදු 87ක්. හැබැයි වාසු තාමත් ෆිට් එකේ මේ මැච් එක ගහගෙන ඉන්නවා. ඒ නිසා වාසුගේ පෙනුම බැලුවත් එහෙම වයස්ගත පෙනුමක් පේනෙන්නෙ නැහැ. ඉතින් ඔය කතාව තමයි අපිට කියන්න ඕනෙ වුණේ.

වෛද්‍ය චමල් සංජීව කියනවා ඉන්දියාවෙත් මේ විදිහම තමයි, ඉන්දියාවෙත් බොහොම වයස්ගත දේශපාලකයෝ ඉන්නවා කියලා. කොහොම හරි අපි බලමු ලංකාවේ දේශපාලකයන්ට මෙච්චර ෆිට් එකක් තියෙන්නේ කොහොමද කියලා. ඔබට පුළුවන් දේශපාලකයෙක්ගෙන්ම ඒක අහගන්න. දේශපාලකයෝ මේ ප්‍රධාන ධාරාවේ තමන්ගේ ශක්තිය ආරක්ෂා කරගෙන තියෙන්නේ කොහොමද කියලා. අපිට ඒගොල්ලන්ගෙන්ම තමයි අහන්න වෙන්නේ.



ජීවන පහන් තිළිණ

උපාධිධාරීන් 900කට
BCAS CAMPUS
උපාධි පිරිනමයි





BCAS Campus විසින් 2025 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) දී අභිමානවත් අයුරින් පවත්වන අතර, ජාත්‍යන්තරව පිළිගත් අධ්‍යයන වැඩසටහන් සාර්ථකව සම්පූර්ණ කළ උපාධිධාරීන් 900කට අධික පිරිසකගේ ජයග්‍රහණ මෙහිදී සමරනු ලැබේ.

මෙම උත්සවය සඳහා උපාධිධාරීන්, දෙමාපියන්, ආචාර්ය මණ්ඩලය, අධ්‍යාපනික විශේෂඥයන්, ආයතනික ප්‍රධානීන් සහ විශේෂ ආරාධිතයන් රැසක් එක්ව BCAS සිසුන්ගේ ජීවිතයේ වැදගත් අධ්‍යාපනික සන්ධිස්ථානයක් සැමරීම මෙහිදී සිදුවිය. ශ්‍රී ලංකාව තුළ ගෝලීය වශයෙන් පිළිගත් උසස් අධ්‍යාපන මාර්ගෝපදේශ සැපයීම පිළිබඳ BCAS Campus හි අඛණ්ඩ කැපවීම මෙම අවස්ථාව තුළින් තවදුරටත් අවධාරණය වේ.

මෙවර උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධිධාරීන් 906 දෙනෙකුගේ ජයග්‍රහණ ඇගයීමට ලක්කරන අතර එම සංඛ්‍යාවට උපාධි සහ පශ්චාත් උපාධිධාරීන් 241 දෙනෙකු, Pearson Higher National Diploma (HND) උපාධිධාරීන් 625 දෙනකු සහ Pearson Level 7 Diploma උපාධිධාරීන් 40 දෙනකු ඇතුළත් වේ.




# එල්ලී මැරීම සහ එල්ලී හිඳීම



ජීවන පහන් තිළිණ

**සියදිවි නසාගැනීමක් සජීවීව මුළු රටම නැරඹුවා. මේ සිදුවීමත් එක්ක එදා රාත්‍රියේ සිට මේ දක්වාම ඇතිවෙලා තියෙන්නේ විශාල කැලඹීමක්. මේ කැලඹීම ගැන විවිධ තැන්වල විවිධ ආකාරයෙන් කතා කරනවාත් ඇහෙනවා. නමුත් මෙය ඇත්තටම විශේෂයෙන්ම කතාකළ යුතු සහ සාකච්ඡාවට බඳුන් කළ යුතු මාතෘකාවක්.**

සියදිවි නසාගැනීම අයිති වෙන්නේ අතිශය පෞද්ගලික කාරණාවකට. සියදිවි නසාගැනීමක් සම්බන්ධව අපට කිසිසේත්ම කිසිවකුට චෝදනා කරන්න අවශ්‍යතාවක් නැහැ. සියදිවි නසාගැනීමක් සාධාරණීකරණය කරන්න අපි කිසිසේත්ම උත්සාහ කරන්නෙත් නැහැ. නමුත් සියදිවි නසාගැනීම් සම්බන්ධව හොයලා බැලුවොත් ශ්‍රී ලංකාවේ සියදිවි නසාගැනීම් විශාල ප්‍රමාණයක් වාර්තා වෙනවා. ඒ වාර්තා වෙන ප්‍රමාණයන් ගත්තම වැඩිම සියදිවි නසාගැනීම් වාර්තා වෙලා තියෙන්නේ අනුරාධපුරයෙන් සහ පොළොන්නරුවෙන් කියලා කියැවෙනවා. නමුත් ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් සියදිවි නසාගැනීම් 3,000කට ආසන්න ප්‍රමාණයක් එක වසරකදී වාර්තා වන බව සඳහන් වෙනවා. ස්ත්‍රී පුරුෂභාවය අනුව බැලුවොත් එහෙම 80%ක්ම සියදිවි නසාගන්නා අය පිරිමි පාර්ශ්වය කියලා තමයි සඳහන් වෙලා තියෙන්නේ.

කොහොම වුණත් සියදිවි නසාගැනීම් පිළිබඳ 2024 වර්ෂයේ විශේෂයෙන් හඳුනාගෙන තියෙනවා. ස්ත්‍රී පුරුෂභාවය අනුව සෑම පුද්ගලයන් ලක්ෂයකින්



27 දෙනෙක් සියදිවි නසාගැනීමට උත්සාහ කිරීමට ඉඩ තියෙනවා කියලා. ගෙල වැලලාගැනීම් සමස්ත මරණවලින් 68%ත් 70%ත් අතර, වස පානය කිරීමෙන් මරණ 14%ත් 15%ත් අතර, දුම්රියට පැනීම, ගඟට වැවට පැනීම ආදී සහ ඖෂධ අධිමාත්‍රාව ගැනීම් සඳහන් වෙන්නේ ඊළඟට කියලා තමයි සඳහන් වෙන්නේ.

මේ සියදිවි නසාගැනීම් පොලිස් සංඛ්‍යාලේඛනවලට අනුව නිවැරදිව සඳහන් වෙන්නේ 2024 වසරේදී. නිල වශයෙන් සමස්ත සියදිවි නසාගැනීම් සංඛ්‍යාව 3,285ක් විදිහට. පිරිමි මරණ 2,664ක්, කාන්තා මරණ 621ක්, ළමා සහ යොවුන් වියේ මරණ 98ක් වාර්තා වෙලා තියෙනවා කියලා සඳහන් වෙනවා. මින් ළාබාලතම දරුවා වෙන්නේ වයස අවුරුදු අටක දරුවෙක්. වැඩිහිටි ප්‍රජාව අතරින් වයස අවුරුදු 71ට වැඩි මරණ 381ක් වාර්තා වෙලා කියලා සඳහන් වෙනවා. 2024 වර්ෂයේදී දිනකට දළ වශයෙන් පුද්ගල මරණ නවයක් වාර්තා වෙලා තියෙන බව තමයි සඳහන් වෙලා තියෙන්නේ.

සියදිවි නසාගැනීම් සම්බන්ධව බොහෝ මාධ්‍ය මේ වෙලාවේ වාර්තා කරන්නේ සියදිවි නසාගැනීම් උත්කර්ෂයට නැංවිය යුතු නැති බවට. ඒක ඇත්ත. සියදිවි නසාගැනීමක් කිසිසේත්ම උත්කර්ෂයට නැංවිය යුතු නැහැ. සියදිවි නසාගැනීමක් කියලා කියන්නේ සතුටු වෙන්නවත්, අත්පුඩියක් ගහන්නවත්, වීරයෙක් බවට පත්වෙන්නවත් කාරණයක් නෙමෙයි.

එක සිදුවීමක් සිද්ධ වුණාට පස්සේ අපි ඔහුගේ නම ගම දාලා විස්තර කරලා ඔහු ගැන කවි කතන්දර ලියන්න හදනවා නෙමෙයි. සමාජ මාධ්‍ය ඇතුළේ මේ සියදිවි නසාගැනීම ගැන විවිධ ස්ථානවල කතා කරනවා අපි දකිනවා. විවිධ මට්ටමින් කතා කරනවා අපි දකිනවා. ඒ සියදිවි නසාගත්ත පුද්ගලයාගේ අම්මා, තාත්තා, නෑදෑයෝ, පෙම්වතිය, බිරිඳ, සහෝදර සහෝදරියෝ, කවුරු හරි කෙනෙක් ගැන ඉතාම නරක ආකාරයෙන් සමාජ මාධ්‍යවල විවිධ තැන්වල විවිධාකාරයෙන් විස්තර වෙනවා. ඇත්තටම මේක හරිම පහත් සහ ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මෙවැනි තත්ත්වයක් නිර්මාණය නොවිය යුතුයි කියලා අපි මේ කියන්න උත්සාහ කරන්නේ.

ඔහු මියගියා. ඔහු සජීවීව තමන්ගේ මරණය පෙන්වමින් මියගියා. ඒක ඉතාම නරක සහ පහත් ක්‍රියාවක්. ඔහුගේ පෞද්ගලික වැඩක් ඔහු ඇයි එළියට පෙන්නන්නේ? ඒකෙන් කී දෙනෙක් පීඩාවට පත්වුණාද? කී දෙනෙක් කලබලයට පත්වුණාද? ඇත්තටම ඔහු ඒ කරපු වැඩේ ගැන කිසිසේත්ම අපිට එකඟ වෙන්නවත්, ඒකට උදව් කරන්නවත්, ඒකෙන් ඔහු බේරගන්නවත් පුළුවන්කමක් නැහැ. ඔහුට අවශ්‍ය වෙන්න ඇත්තේ ඔහුගේ පෞද්ගලික දේ ලෝකෙට පෙන්නලා මේක අතහැරලා දාලා එයාට යන්න වෙන්න ඇති. ඒකෙන් පීඩාවට පත්වෙන්නේ ඔහුගේ අම්මා, ඔහුගේ පවුලේ අය. ඒ පීඩාව ඔබ දැක්කා නම් ඔබට දැනෙන්න ඇති. අම්මා ඇවිල්ලා එතන කෑගහන හැටි, වේදනා විඳින හැටි අපි දැක්කා. ඉන් පස්සේ ආයෙමත් අපි මොකද කරන්නේ මේ අම්මාව දැන් සමාජ මාධ්‍ය ඇතුළේ විවේචනයට ලක්කරමින් නොදන්නා කයිකතන්දර කියමින්, හරි හෝ වැරදි කාරණා, අපිට වැඩක් නැති දේවල් කතාකරන තැනට පත් වෙලා තියෙනවා.

> **මේ මිනිස්සුන්ට මේ තත්ත්වයට පත්වෙන්න හේතු වුණු කාරණා මොනවද කියලා අපි දන්නේ නෑ. ඒ මනුස්සයා මැරුණා, ඒ මනුස්සයට ඉන්න දෙන්න. තව කෙනෙක් නොමැරෙන්න කටයුතු සූදානම් කරමු.**

මේ මිනිස්සුන්ට මේ තත්ත්වයට පත්වෙන්න හේතු වුණු කාරණා මොනවද කියලා අපි දන්නේ නෑ. ඒ මනුස්සයා මැරුණා, ඒ මනුස්සයට ඉන්න දෙන්න. තව කෙනෙක් නොමැරෙන්න කටයුතු සූදානම් කරමු. ඔහුගේ මරණයේ වංහුං අපිට වැඩක් නැහැ. ඔහු මැරුණේ ඇත්තටම මොනවා වෙලාද කියලා අපිට වැඩක් නෑ. අපිට ඒක අදාළ නැහැ. අපිට ඒ සම්බන්ධව තර්ක විතර්ක, කරුණු කාරණා විස්තර කරන්න අවශ්‍ය නැහැ. මරණය කියලා කියන්නේ කාටත් පොදු දෙයක්. අපි හැමෝටම මේක එනවා. ඒ නිසා මේක කෙනෙකුට ආවේ කොහොමද, එයා ඒක ගෙන්න ගත්තේ කොහොමද කියන එක කවි සින්දු ලියන්න කාරණයක් නෙවෙයි කියන එකයි අපිට මේ වෙලාවේ කියන්න අවශ්‍ය වුණේ.

ඔහුගේ මරණය ගැන තවදුරටත් සමාජ මාධ්‍ය තුළ කතා කරන්න එපා. ඔහුගේ මරණය කොහොම හරි වීඩියෝ කරගෙන ඒක ෂෙයාර් කරලා වීව්ස් වැඩි කරගන්න හදන්න එපා. ඒකෙ ස්ක්‍රීන් ෂොට් ගහලා ඒවායේ හොඳ නරක කියන්න උත්සාහ කරන්න එපා. පළමුවැනි වැරදිකාරයා තමයි පෞද්ගලික වැඩේ පෞද්ගලිකව කරගත්තේ නැති අදාළ පුද්ගලයා. හැබැයි දැන් අපිට ඒ මනුස්සයට ඒක කියන්න බැහැ. ඒ මනුස්සයා මැරිලා ඉවරයි. ඒ මනුස්සයා ජීවිතයෙන් ගිහින් ඉවරයි. අපි තවදුරටත් ඒ මනුස්සයාව ආයෙ ආයෙ මරන්නේ නැතුව, ඒ පවුලේ මිනිස්සුන්ටත් සියදිවි නසාගන්න අවශ්‍ය කරන කාරණා හදන්නේ නැතුව ඒ මිනිස්සුන්ට ඉන්න දෙමු. වැදගත්ම දේ ඒකයි.

## සුද්දන් මීගමුවට ගේන MMR 26




Maris Motor Rally 2026 හෙවත් MMR 26 මෙවර අගෝස්තු මාසයේදී වඩාත් පුළුල් සංචාරක, ප්‍රජා සහ ආර්ථික සංවර්ධන දැක්මක් සමග නැවත පැවැත්වීමට නියමිතය. දේශීය සහ විදේශීය සංචාරකයන් සඳහා මීගමුව ජීවමාන හා ආකර්ෂණීය සති අන්ත ගමනාන්තයක් ලෙස ස්ථානගත කිරීම මෙවර වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.

මීගමුව මාරිස් ස්ටෙලා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධාන කරනු ලබන MMR 26, මෝටර් රථ ක්‍රීඩා, ජාත්‍යන්තර සංගීත විනෝදාස්වාදය, හෝටල් හා අවන්හල් හවුල්කාරිත්ව, සංචාරක අත්දැකීම් සහ වසර පුරා ක්‍රියාත්මක වන ආයතනික සමාජ වගකීම් වැඩසටහන් එක් වේදිකාවක් යටතට ගෙන එනු ඇත.

මෙම වැඩසටහන මගින් මීගමුවේ හෝටල්, අවන්හල්, ප්‍රවාහන සේවා සපයන්නන්, සුළු වෙළෙඳුන්, තරුණ කණ්ඩායම් සහ ප්‍රජා මූලික ව්‍යාපාර සඳහා පුළුල් ආර්ථික ප්‍රතිලාභ සහ නව ආදායම් අවස්ථා උදාකර දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.



රාජ්‍ය රහස්




# විරෝධය මැද්දේ අනුර ගත්ත තීන්දුව

## බරපතළ සංඝදාවක්

**මිගමු බන්ධනාගාර ගැටුමේ උණුසුම මැද වුවද පසුගිය සතිය වනවිට දේශපාලන ක්ෂේත්‍රයේ ලොකුවට කතාවූ තවත් විශාලම ප්‍රවෘත්තියක් වූයේ උතුරු නැගෙනහිර සහ වතුකරයේ දෙමළ මුස්ලිම් පක්ෂ ඒකාබද්ධව පාර්ලිමේන්තුවේ පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවය.**

මෙම මාධ්‍ය හමුවට එම්.ඒ. සුමන්තිරන්ගේ නායකත්වයෙන් යුත් තමිල් අරසු කච්චි පක්ෂය, රවුෆ් හකීම්ගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, රිෂාඩ් බදියුදීන්ගේ නායකත්වයෙන් යුත් සමස්ත ලංකා මුස්ලිම් කොංග්‍රසය, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් වතුකරයෙන් පාර්ලිමේන්තුවට තේරීපත්වූ ජීවන් තොණ්ඩමන්, දෙමළ ප්‍රගතිශීලී පෙරමුණ නියෝජනය කරමින් මනෝ ගනේෂන්, පලනි දිගම්බරම් ඇතුළු රටම නියෝජනය වන පරිදි සියලු දෙමළ මුස්ලිම් පක්ෂ නායකයන් එකතු වී සිටි ආකාරයක් දැකගන්නට ලැබිණි. මෙහි ඇති විශේෂත්වය වන්නේ සමගි ජන බලවේගය ප්‍රමුඛ සමගි ජන සන්ධානය නියෝජනය කරන හකීම්, රිෂාඩ්, මනෝ සහ දිගම්බරම්ද මෙම මාධ්‍ය හමුවට එක්ව සිටීමය.

ඒ අනුව විපක්ෂයට පහර දෙන ඇතැම් මාධ්‍ය සහ යම් යම් දේශපාලන විචාරකයන් විශාල මාධ්‍ය ප්‍රචාරයක් රැගෙන යමින් මේ සම්බන්ධයෙන් කියා සිටියේ සජබයෙන් මන්ත්‍රීවරු 18 දෙනෙක් ඉවත් වී වෙනම සන්ධානයක් නිර්මාණය කිරීමට කටයුතු කොට ඇතැයි කියාය. විපක්ෂය දෙකට තුනට බිඳී ඇතැයි කියාය. විපක්ෂය අවසන් යැයි කියාය.

නමුත් මෙම සන්ධානය පසුපස ඇති ඇත්ත කතාව මේ ආණ්ඩුවට කඩේ යන කිසිදු මාධ්‍ය නාලිකාවක් හෝ සමබරව පුවත් පළකරනවා යැයි කියන කිසිදු මාධ්‍යයක් හෝ කිසිදු සමාජ මාධ්‍යයක් හෝ පළකොට තිබුණේ නැත. නමුත් සෑම අවස්ථාවකදීම අතිශය නිවැරදි තොරතුරු අප පාඨකයන් වෙත ගෙන එන 'රාජ්‍ය රහස්' තීරය මෙම දෙමළ - මුස්ලිම් දේශපාලන සන්ධානය පිටුපස ඇති ඇත්ත කතාව කුමක්ද යන්න පිළිබඳ පසුගිය සතියේ දීර්ඝ සොයාබැලීමක නිරත විය. ඒ අනුව, අපට සොයාගැනීමට හැකි වූයේ මෙම නව දේශපාලන සන්ධානය හරහා ආණ්ඩුවට අතිභයානක දේශපාලන සංඝදාවක් නිකුත් කොට ඇති බවය.

'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ අප මුල සිටම වාර්තා කළ ප්‍රධාන කරුණක් වූයේ පළාත් සභා මැතිවරණය නොපැවැත්වීම මුල්කරගෙන මොන යම් හෝ අවස්ථාවක ආණ්ඩුවට අතිශය බරපතළ තත්ත්වයකට මුහුණ දීමට සිදුවනු ඇති බවය. විශේෂයෙන්ම මීට මාස කිහිපයකට පෙර තමිල්නාඩුවේ මහඇමැතිවරයා වශයෙන් තලපති විජේ පත්වීම හරහා මෙම බලපෑම ඉක්මන් වනු ඇති බව අපි සඳහන් කර සිටියෙමු. මෙතෙක් ලංකාවේ උතුරු නැගෙනහිර සහ වතුකරයේ දෙමළ ජනතාව සම්බන්ධයෙන් යම් යම් තීරණාත්මක අවස්ථාවලදී ඉන්දීය මධ්‍යම රජය මැදිහත් වීම සිදුකරන ආකාරයක් පසුගිය කාලය පුරාම අප අත්දැක ඇත්තෙමු. නමුත් තලපති විජේගේ දේශපාලන ආගමනයත් සමග අප පෙන්වා දුන් ප්‍රධාන කාරණාවක් වූයේ ඉන්දීය මධ්‍යම රජයට පෙරාතුව ලංකාවේ යම් යම් දේශපාලන සිදුවීම්වලදී තමිල්නාඩුවෙන් බලපෑම් එනු ඇති බවත්, එම බලපෑම විවිධ ක්‍රම ඔස්සේ ඉන්දීය මධ්‍යම රජයටද එල්ල වනු ඇති බවත්ය. අද අපි 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ හෙළිදරව් කිරීමට සූදානම් වන්නේ එම ඉන්දියානු දේශපාලන බලපෑම මේ වනවිට ආරම්භ වී ඇති බවය. ඒ නිසා විවිධ න්‍යායපත්‍ර මත පිහිටා සිදුකරන මාධ්‍ය ප්‍රචාරයන්ට, බොරු පුවත්වලට, බොරු දේශපාලන විග්‍රහවලට නොරැවටෙන ලෙස ජනතාවගෙන් ඉල්ලීමක් කිරීමටද මෙවර 'රාජ්‍ය රහස්' තීරය සූදානම්ය.

කෙසේ වෙතත් පවතින දේශපාලන තත්ත්වය යටතේ මේ මොහොතේ ආණ්ඩුවද සිටින්නේ කිසිසේත්ම පළාත් සභා මැතිවරණය පැවැත්විය හැකි දේශපාලන වටපිටාවක නම් නොවේ. පසුගිය කාලය පුරා පැලවත්තෙන් කරන ලද සියලු සමීක්ෂණවලදී ලැබුණු ප්‍රතිචාරය වූයේ පළාත් සභා මැතිවරණය කිසිසේත්ම නොපවත්වන ලෙසත්, යම් හෙයකින් පළාත් සභා මැතිවරණය පැවැත්වුවහොත් බරපතළ දේශපාලන ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදුවනු ඇති බවත්ය. අප අවස්ථා කිහිපයකදීම මේ තොරතුර උදාහරණ සහිතව මීට පෙර 'රාජ්‍ය රහස්' තීරයේ වාර්තා කර ඇත්තෙමු. ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මහතා යාපනයට ගිය අවස්ථාවේදී පළාත් සභා මැතිවරණය මේ වසරේ පැවැත්වීමට නොහැකි බවටත්, ඒ සඳහා වෙන්කොට තිබූ මුදල් දිට්වා සුළි කුණාටුවෙන් සිදුවූ හානියට වියදම් කිරීමට සිදුවූ බවටත් ප්‍රකාශ කළේද පක්ෂයෙන් එල්ල වෙමින් තිබූ ඒ බලපෑම නිසාමය. නමුත් ටිල්වින් කී එම කතාව සම්පූර්ණයෙන්ම අසත්‍යයක් බව ඊට දින දෙක තුනකට පසුව පැවැති කැබිනට් මාධ්‍ය හමුවේදී ඇමැති නලින්ද ජයතිස්ස මහතා ප්‍රකාශ කර සිටියේය. මීට අමතරව පසුගිය සතියේදී අගමැති හරිනි අමරසූරියද පාර්ලිමේන්තුවේදී විශේෂ ප්‍රකාශයක් කරමින් කියා සිටියේ පළාත් සභා මැතිවරණයට වෙන් කළ මුදල් දිට්වා සුළු කුණාටුව වෙනුවෙන් වියදම් කොට නොමැති බවත්, පළාත් සභා මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය මුදල් රජය විසින් වෙන්කොට ඇති බවත්ය. කෙසේ වෙතත් ටිල්වින් එක කතාවක් කියද්දී එය ප්‍රතික්ෂේප කරමින් කැබිනට් මාධ්‍ය ප්‍රකාශක නලින්දත්, අගමැති හරිනි අමරසූරියත් මේ ආකාරයට වෙනත් කතාවක් කියා සිටියේ ටිල්වින්ගේ ප්‍රකාශය හරහා ආණ්ඩුවේ දේශපාලන වැඩපිළිවෙළටත්, ආර්ථික ප්‍රතිපත්තියටත් බරපතළ ප්‍රහාරයක් එල්ල වීම අරම්භ වී තිබීම නිසා විය යුතුය.

## පටන් ගත් තැන

**මෙවැනි පසුබිමක් යටතේ පසුගිය සතියේ දෙමළ මුස්ලිම් පක්ෂ එක මේසයක අසුන් ගත්තේ හදිසියේ සිදුවූ දේශපාලන සිද්ධියක් මත නොව, මාස එකහමාරකට පෙර සිටම පැවැති සාකච්ඡා මාලාවක ප්‍රතිඵලයක් ලෙසය. ඒ අනුව මෙහි පළමු සාකච්ඡාව පැවැතියේ පසුගිය ජූනි 03 වැනිදා තමිල් අරසු කච්චි පක්ෂයේ මහලේකම්වරයා වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මහතාගේ කොළඹ පිහිටි නිවසේය.**

ඊට දෙමළ මුස්ලිම් පක්ෂ නායකයන් කිහිප දෙනකු හැරුණු විට අනෙක් සියලු දෙනාටම ආරාධනා කිරීමට ඒ සඳහා මූලිකත්වය ගත් තමිල් අරසු කච්චි පක්ෂය කටයුතු කොට තිබිණි. ඒ අනුව ඊට හිතාමතාම මන්ත්‍රීවරුන් සිවුදෙනකුට ආරාධනා නොකිරීමට ඔවුන් කටයුතු කොට තිබිණි. ඉන් පළමු වැන්නා වූයේ උතුරෙන් මෙවර පළමු වරට පාර්ලිමේන්තුවට තේරීපත්වූ අර්චුනා රාමනාදන්ය. දෙවැන්නා වූයේ කාදර් මස්තාන්ය. තුන්වැන්නා ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම්ය. සිවුවැන්නා ඉම්රාන් මහරූෆ්ය. විවිධ දේශපාලන කරුණු අරමුණු කොට ගෙන මේ සිවුදෙනාට ආරාධනා නොකිරීමට දෙමළ, මුස්ලිම් දේශපාලන පක්ෂ නායකයන් අතර මුල සිටම එකගත්වයක් තිබිණි.

ඒ අනුව සුමන්තිරන්ගේ නිවසට රැස්වූ අනෙකුත් දෙමළ, මුස්ලිම් පක්ෂ නායකයන් හා නියෝජිතයන් ප්‍රධාන කරුණු 3ක් සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කිරීමට පියවර ගත්තේය. එම ප්‍රධාන මාතෘකා 3 වූයේ අලුත් ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීම, පළාත් සභා මැතිවරණය පැවැත්වීම, උතුරු නැගෙනහිර සහ වතුකරයේ දෙමළ ජනතාව මුහුණ දෙන ඉඩම් ප්‍රශ්න විසඳීමය. මෙම මාතෘකා 3 සම්බන්ධයෙන්ම පසුගිය ජනාධිපතිවරණයේදීත්, ඊට පසුවත් මාලිමා ආණ්ඩුවේ ප්‍රධානීන් විසින් ලබාදී තිබූ පොරොන්දු සමුදායක් තිබිණි. එහිදී ජනාධිපතිවරයාත්, ආණ්ඩුවේ අනෙකුත් ප්‍රධානීනුත් යාපනයටම ගොස් ප්‍රසිද්ධියේ ලබාදී තිබූ පොරොන්දුවක් වූයේ අලුත් ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරන බවටත්, වහාම පළාත් සභා මැතිවරණය පවත්වන බවටත්, උතුරේ හමුදාව සතුව තිබෙන ඉඩම් සිවිල් වැසියන් වෙත නිදහස් කිරීමට පියවර ගන්නා බවටත්ය. නමුත් ආණ්ඩුවට වසර 2ක් ගෙවී ඇති නමුත් මේ දක්වා අලුත් ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීමක් හෝ ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්වෙන ආකාරයක් දැකගන්නට නැත. පළාත් සභා මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන්ද ආණ්ඩුව සිටින්නේ එය පවත්වනවාට වඩා හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ කළාක් මෙන් නොපවත්වන තැනට වැඩකටයුතු සිදුකරමින්ය. ඉඩම් නිදහස් කිරීමේදී යම් ප්‍රගතියක් අත්කරගෙන ඇති නමුත්, තවමත් උතුරු නැගෙනහිර විශාල භූමි ප්‍රමාණයක් පවතින්නේ ආරක්ෂක අංශ සතුවය.

ඒ අනුව පළමු සාකච්ඡාවේදීම මෙම මාතෘකා 3 මුල්කරගෙන සියලු දෙමළ මුස්ලිම් දේශපාලන පක්ෂ ඒකාබද්ධව කටයුතු කළ යුතු බවට වූ ස්ථාවරයකට සහ එකගතාවකට පැමිණීමට ඔවුන් පියවර ගෙන තිබිණි. ඒ අනුව තවදුරටත් මේ දේශපාලන පක්ෂ සම්බන්ධීකරණය සඳහා කැඳවුම්කරුවකු පත්කළ යුතු බවට ජීවන් තොණ්ඩමන් කියද්දී හකීම් ඊට ප්‍රතිචාර දක්වමින් කියා සිටියේ භාෂා 3ම මනාව හැසිරවිය හැකි එමෙන්ම සියලු දේශපාලන පක්ෂ නායකයන් සමග හොඳ සම්බන්ධතාවක් පවත්වාගෙන යන ශානක්‍යන් රාසමානික්කම් ඊට සුදුසු යැයි කියාය. ඒ අනුව ඊට සියලු දෙනාගේම එකගතාව හිමිවූ ආකාරයක් දැකගත හැකි විය. අනතුරුව අවස්ථා කිහිපයකදීම පාර්ලිමේන්තුවේදීත්, ඉන් පිටතදීත් මේ දෙමළ මුස්ලිම් පක්ෂ නායකයන් හමුවී මෙම මාතෘකා තුන සම්බන්ධයෙන් දීර්ඝව සාකච්ඡා කිරීමටත්, ඒකාබද්ධ මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා මේ සම්බන්ධයෙන් රටට දැනුම් දීමටත් තීරණය කොට තිබිණි.

කෙසේ වෙතත් එහිදී තවත් විශේෂ එකගතාවකට පැමිණීමටද ඔවුහු කටයුතු කළහ. ඒ, පාර්ලිමේන්තුවේදී හෝ ඉන් පිටතදී මතුවන විවිධ ප්‍රශ්නවලදී එකී පක්ෂවලට තමන්ගේ අනන්‍යතාව අනුව තීන්දු තීරණ ගැනීමට කිසිදු බාධාක් නොමැති බවය. නමුත් නව ව්‍යවස්ථාවක් සකස් කිරීම, පළාත් සභා මැතිවරණය පැවැත්වීම, ඉඩම් ප්‍රශ්නය යන මාතෘකා තුනේදී සියලු දෙමළ මුස්ලිම් පක්ෂ එක් ස්ථාවරයකට අනුව කටයුතු කළ යුතු බව මෙහිදී තීන්දු විය.

මීට අමතරව මේ ආකාරයේ දෙමළ මුස්ලිම් පක්ෂ එකතුවකට බලපෑ තවත් විශේෂ කාරණාවක්ද තිබිණි. ඒ, පසුගිය 2019 ජනාධිපතිවරණයේදීත්, 2024 ජනාධිපතිවරණයේදීත් දකින්නට ලැබුණු ඡන්ද ප්‍රතිඵලයය. මෙහිදී 2019දී ගෝඨාභය රාජපක්ෂ ජයග්‍රහණය කර තිබුණේත්, 2024දී අනුර කුමාර ජයග්‍රහණය කර තිබුණේ අතිබහුතරයක් වූ දකුණේ සිංහල බෞද්ධ ඡන්ද පදනම් කරගෙනය. එය ප්‍රතිශතයක් වශයෙන් ගත් විට 76% ක් වී තිබිණි. එම ප්‍රතිඵලයේදී සියලු දෙමළ මුස්ලිම් ඡන්ද ප්‍රමාණය 24%කට සීමා වී තිබිණි. ඒ අනුව දෙමළ මුස්ලිම් පක්ෂ අතර කාලයක් තිස්සේ අවධානයට යොමුවූ කරුණක් වී තිබුණේ යම් හෙයකින් එළැඹෙන ජනාධිපතිවරණයද සිංහල බෞද්ධ ඡන්ද පදනම පමණක් උපයෝගී කොට ගනිමින් ජයග්‍රහණය කිරීමට යම් අපේක්ෂකයකු සමත් වුවහොත් එය දෙමළ මුස්ලිම් පක්ෂවල කේවල් කිරීමේ හැකියාවට බරපතළ ප්‍රශ්නයක් වනු ඇති බවය. දෙමළ මුස්ලිම් ජනතාවගේ මතයට සහ හඬට කිසිදු වටිනාකමක් නොලැබෙනු ඇති බවය. ඒ අනුව දැන්ම තියා සියලු දෙමළ මුස්ලිම් දේශපාලන පක්ෂ ඒකාබද්ධ වී සිය හඬට යම් ශක්තියක් ලබාගත යුතු බව ඔවුන්ගේ අදහස වී තිබිණි. මේ දෙමළ මුස්ලිම් පක්ෂවල එකමුතුව පසුපස එම අරමුණද නොතිබුණා නොවේ.

## පණිවුඩය ඉන්දියාවෙන්?

**මේ අතරවාරයේ ආණ්ඩුවද මේ වනවිට උතුරු නැගෙනහිර දෙමළ මුස්ලිම් ජනතාවගේ මෙන්ම වතුකරයේ මලෙයිගම් ජනතාවගේ හිත් දිනාගැනීම සඳහා විශේෂ දේශපාලන ව්‍යාපෘති කිහිපයක්ම දියත් කර ඇති ආකාරයක් දැකගැනීමට පුළුවන. මන්ද ආණ්ඩුවේ ස්ථාවරය වී ඇත්තේ ඉදිරියේදී පවත්වන ජාතික මැතිවරණයකදී ඉතිහාසයේ මෙන් නොව දකුණේ සිංහල බෞද්ධ ඡන්ද එකට එක්වෙනවාට වඩා බෙදී යෑමේ ඉඩකඩ වැඩි බවය.**

එවැනි අවස්ථාවකදී මැතිවරණයක ජයග්‍රහණය තීන්දු කිරීමට බලපාන ප්‍රධාන සාධකය වන්නේ උතුරු නැගෙනහිර සහ වතුකරයේ දෙමළ මුස්ලිම් ඡන්දය. නමුත් මේ රටේ දේශපාලනය ගැන, උතුරු නැගෙනහිර සහ වතුකරයේ දේශපාලන හැසිරීම ගැන දන්නා මෝඩයෙක් නොවන ඕනෑම කෙනකු පිළිගත් සත්‍යය වන්නේ මෙම සියලු දෙමළ, මුස්ලිම් දේශපාලන පක්ෂ සිය දේශපාලන තීන්දු තීරණ ගැනීමේදී ඉන්දියාව සමග තමිල්නාඩුව සමග විශාල වශයෙන් බැඳී ඇති බවය. ඔවුන් සමග සාකච්ඡා කොට තීන්දු තීරණ ගන්නා බවය. ඔවුන්ගෙන් එන පණිවුඩවලට අනුව තීන්දු තීරණ ගන්නා බවය. ඒ අනුව අලුත් ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම, පළාත් සභා මැතිවරණය පැවැත්වීම, ඉඩම් ප්‍රශ්නය විසඳීම යන උතුරු නැගෙනහිර සහ වතුකරයේ දෙමළ ජනතාවට බලපාන ප්‍රධානතම කාරණා 3 සම්බන්ධයෙන් ඒකාබද්ධ දේශපාලන සන්ධානයක් බිහිවෙද්දී ඉන්දියාවේ සහ තමිල්නාඩුවේ අනුදැනුම මත එවැන්නක් සිදු නොවනු ඇති බවක් කිසිසේත්ම සිතිය නොහැක. ඒ අනුව ගොඩනැගෙමින් පවතින මේ දේශපාලන බලපෑම හමුවේ දේශපාලනය දන්නා අයට අනුව නම් ලබන වසර ඇතුළතදී ආණ්ඩුවට පළාත් සභා මැතිවරණය පවත්වන ලෙසට විශාල බලපෑමක් උතුරු නැගෙනහිරින් සහ වතුකරයෙන් එල්ල වීමට නියමිතය.

ඒ අනුව මෙම අලුත් දේශපාලන සන්ධානයද මේ වනවිට තීරණය කොට ඇත්තේ අලුත් ව්‍යවස්ථාව, පළාත් සභා මැතිවරණය සහ ඉඩම් ප්‍රශ්නය යන මාතෘකා තුන මුල්කරගෙන පළමු අදියරේදී ජනාධිපතිවරයා හමුවී විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමටය. පසුගිය කාලයේ දී මෙන් වචන හරඹවල යෙදෙමින් පළාත් සභා මැතිවරණය පැවැත්වීම කල් දැමීමට ජනාධිපතිවරයා උත්සාහ දරන්නේ නම් මෙම ප්‍රශ්නය ජාත්‍යන්තරය දක්වා රැගෙන යෑමට මෙම දෙමළ මුස්ලිම් දේශපාලන සන්ධානය දැනටමත් තීරණය කොට අවසානය.

## අනුර මොනවද කරන්නේ?

**මේ සියලු කරුණු මැද්දේ ජනාධිපතිවරයා මේ දිනවල සිදුකරන්නේ කුමක්ද?**

**වෙනදා නම් ජනාධිපතිවරයා විවිධ දේශපාලන සිදුවීම් මුල්කරගෙන ප්‍රසිද්ධියේ විවිධ උත්සව අවස්ථාවලදී අදහස් දක්වන ආකාරයක් දැකිය හැකි වුවත්, පසුගිය සති කිහිපය පුරා විවිධ දේශපාලන සිදුවීම් සිදුවුවත් ජනාධිපතිවරයා යම් නිහඬතාවක සිටින ආකාරයක් බොහෝ දෙනාට දැකගන්නට ලැබිණි. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට පැමිණියද එහිදීද අදහස් දැක්වූ ආකාරයක් දැකගන්නට ලැබුණේ නැත.**

කෙසේ වෙතත් ප්‍රසිද්ධියේ ජනාධිපතිවරයා අදහස් දැක්වීමක් සිදු නොකළද, පසුගිය සතියේ ජනාධිපතිවරයා අතිශය තීරණාත්මක සාකච්ඡා දෙකක් අප්‍රසිද්ධියේ පැවැත්වීමට පියවර ගෙන තිබිණි. ඉන් එක් සාකච්ඡාවක් ජනාධිපතිවරයා පැවැත්වූයේ ජවිපෙ සහ මාලිමාව සමගය. දෙවැනි තීරණාත්මක සාකච්ඡාව ජනාධිපතිවරයා පැවැත්වූයේ මුදල් අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයේ ආර්ථික උපදේශකවරුන් සමගය.

මෙහිදී පළමු සාකච්ඡාව ජනාධිපතිවරයා පැවැත්වූයේ මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් සමගය. එහිදී අතිශය වැදගත් තීන්දු තීරණ රැසක් ගැනීමට ජනාධිපතිවරයා කටයුතු කොට තිබිණි. විශේෂයෙන්ම 2027 වසරේ අයවැය එළැඹෙන නොවැම්බර් මාසයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇති බැවින් මෙම සාකච්ඡාවලදී ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නිලධාරීන්ට පැහැදිලිව දැනුම් දීමට ජනාධිපතිවරයා පියවර ගෙන තිබිණි.

මෙහිදී ජනාධිපතිවරයා පළමුවෙන්ම නිලධාරීන්ගෙන් විමසා සිටියේ පසුගිය අයවැයවලදී ආණ්ඩුව වැඩි වශයෙන් වියදම් කොට තිබූ ක්ෂේත්‍රයන් මොනවාදැයි කියාය. එහිදී නිලධාරීන් දැනුම් දී තිබුණේ ආණ්ඩුව වැඩි වශයෙන් වියදම් දරා තිබුණේ සෞඛ්‍යය සහ අධ්‍යාපනය වෙනුවෙන් යැයි කියාය. එහිදී ජනාධිපතිවරයා නැවතත් නිලධාරීන්ගෙන් විමසා සිටියේ ආණ්ඩුව පසුගිය කාලවලදී ප්‍රවාහන ක්ෂේත්‍රය වෙනුවෙන් කොපමණ මුදලක් වෙන්කොට තිබුණාදැයි කියාය. ඊට ප්‍රතිචාර දක්වමින් නිලධාරීන් කියා සිටියේ අවම වශයෙන් අයවැයෙන් 1%ක් හෝ ඊට අඩු ප්‍රමාණයක් ප්‍රවාහනය වෙනුවෙන් වෙන් කිරීමට මෙතෙක් පැවැති ආණ්ඩු කටයුතු කොට තිබූ බවකි. නමුත් මෙහිදී නිලධාරීන්ගෙන් ලැබුණු මෙම පිළිතුරත් සමග ජනාධිපතිවරයා ලබාදුන්නේ සියලු දෙනාම මවිත වන ආකාරයේ පිළිතුරකි.

'ප්‍රතිපත්තියක් විදියට මමත්, අපේ ආණ්ඩුවත් මේ වෙද්දී තීන්දුක් අරන් තියෙනවා ප්‍රවාහනය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරන්න. අපේ රටේ මිනිස්සුන්ට තියෙන ලොකුම ප්‍රශ්නයක් තමයි මේ ප්‍රවාහනය සම්බන්ධයෙන් තියෙන ප්‍රශ්නය. ඊළඟ අයවැයේදී අපි ප්‍රවාහනය පැත්තෙන් ලොකු වෙනසක් කරන්න ඕනේ. බස් සේවය, දුම්රිය සේවය ඉහළම තැනකට ගේන්න අපි කටයුතු කරන්න ඕනේ. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය. සාමාන්‍ය ජනතාවට හොඳ ප්‍රවාහන සේවයක් ලැබෙනවා නම් වාහන ගන්න කෝටි ගණන් සල්ලි වියදම් කරන්න ඕනේ නෑ. අපේ අසල්වැසි රටවලත්, ලෝකයේ වෙනත් රටවලත් ඉහළ මට්ටමේ පොදු ප්‍රවාහන සේවයක් තියෙනවා. හැබැයි අපේ තාමත් තියෙන්නේ පොදු ප්‍රවාහන සේවය කිසිසේත්ම පිළිගන්න පුළුවන් තැනක නෙවෙයි. අපේ ඉලක්කය තමයි තව අවුරුදු 8ක් ඇතුළත මේ තියෙන සියලු පරණ බස් පාරෙන් ඉවත් කරන එක. ඒක අවුරුද්දෙන් දෙකෙන් කරන්න පුළුවන් දෙයක් නෙවෙයි කියලා අපි දන්නවා. හැබැයි දැනටමත් අපි ඒකට ආරම්භය අරගෙනයි තියෙන්නේ. මේ වෙද්දී සියලු මාර්ගවලට ජනතාවගේ ගමනාගමන පහසුව සඳහා අපි මෙට්‍රෝ බස් ගේන්න සැලසුම් කරලයි තියෙන්නේ. ඒක අපි ඉදිරි අවුරුදු 8 ඇතුළත දිගටම ක්‍රියාත්මක කරනවා. මේ තියෙන පරණ බස් ඔක්කොම අයින් කරලා ජනතාවගේ පහසුවට අලුත් ප්‍රවාහන සේවයක් මේ රටේ ඇතිකරනවා...' යැයි කී ජනාධිපතිවරයා දුම්රිය සේවය දියුණු කරන ආකාරය සම්බන්ධයෙන්ද නිලධාරීන් හමුවේ අහස් පළ කළේය.

'ඒ වගේම විශාල ජනතාවක් කාර්යාලවලට එන කොටුව - රාගම, කොටුව - පානදුර, කොටුව - කොට්ටාව යන ප්‍රදේශ මුල්කරගෙන විදුලි දුම්රිය සේවයක් ක්‍රියාත්මක කරන්න අපි තීන්දු කරලා තියෙනවා. දැනටමත් අපි දුම්රිය දෙපාර්තමේන්තුවත් එක්ක මේ ගැන සාකච්ඡා කරලයි තියෙන්නේ. ඒ ව්‍යාපෘතිය අවුරුදු 4කින් අවසන් කරන්න අපිට පුළුවන් කියලා දැනුම් දීමක් කරලා තියෙනවා. ඒක කාර්යාලවලට එන ජනතාවට විශාල ප්‍රයෝජනයක් වේවි...' යනුවෙන් ජනාධිපතිවරයා එහි නිලධාරීන්ට කියා සිටියේය.

## මුලින් ටෙන්ඩර් සල්ලි පස්සේ

**මීට අමතරව අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන්ට හේතුවන විශේෂ කාරණාවක් පිළිබඳවද ජනාධිපතිවරයා මෙහිදී අදහස් ප්‍රකාශ කර සිටියේය.**

'අපි යම් ව්‍යාපෘතියකට අයවැයෙන් මුදල් වෙන් කළාට ඒ මුදල් පාස් වුණාම තමයි අදාළ අමාත්‍යාංශය එම ව්‍යාපෘතියට ටෙන්ඩර් කැඳවන්නේ. එතකොට ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න අවුරුද්දක විතර කාලසීමාවක් යනවා. ඒ කාලය අපරාධයක්. ඒ හින්දා අපි නිශ්චිත වශයෙන් ක්‍රියාත්මක කිරීමට තීරණය කරලා තියෙන ව්‍යාපෘතිවලට දැන්ම කියලා ටෙන්ඩර් කැඳවන්න කටයුතු කරන්න. එතකොට ඒ ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක කරන්න කොහොමත් මාස හත අටක කාලයක් යනවා. ඒ වෙද්දි අපිට පුළුවන් අයවැයෙන් ඒ ව්‍යාපෘතියට අවශ්‍ය මුදල් වෙන්කරලා ඉන්න. එතකොට අයවැය සම්මත වෙච්ච ගමන්ම ඒ ව්‍යාපෘතිය ආරම්භ කරන්නත් අපිට පුළුවන්. එතකොට අවුරුද්දක විතර කාලයක් ඉතුරු කරගෙන ඉතාමත් ඉක්මනින් ව්‍යාපෘතියේ වාසිය ජනතාවට ලබාදෙන්නත් අපිට පුළුවන්. ඒ නිසා මහා භාණ්ඩාගාරය මොන ව්‍යාපෘතිවලටද මුදල් වෙන්කරන්න තීන්දු කරලා තියෙන්නේ කියලා දැන්ම ඒ ඒ අමාත්‍යාංශවලට ලිඛිතව දැනුම් දෙන්න. එතකොට ඒ අයට ටෙන්ඩර් කටයුතු දැන්ම තියා පටන්ගන්න පුළුවනි...' යන්න එහිදී ජනාධිපතිවරයා මහා භාණ්ඩාගාර සහ මුදල් අමාත්‍යාංශ නිලධාරීන්ට දැනුම් දී තිබූ කාරණාව විය.

## ලොකු කැම්පේන් එකක් එනවා

**ඉන් පසු ජනාධිපතිවරයා සහභාගි වූ ප්‍රධාන සාකච්ඡාව වූයේ ජවිපෙ සහ මාලිමාවේ ප්‍රධානීන් සමග පැවැත්වූ සාකච්ඡාවය. මෙහිදී රටේ පවතින වත්මන් දේශපාලන තත්ත්වය සහ අර්බුදකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් එහිදී ඉතා දීර්ඝව අදහස් හුවමාරු වූ ආකාරයක් දැකගන්නට ලැබිණි. ඒ අනුව අවසානයේදී තීන්දු වූයේ ජාතික තලයේ මැතිවරණයක් නොපැවැත්වුණද මුළු රටම ආවරණය වන පරිදි දැවැන්ත දේශපාලන ප්‍රචාරක ව්‍යාපෘතියක් ආරම්භ කිරීමටය.**

එහිදී ජනාධිපතිවරයාගේ සහ මාලිමාවේ ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් දැවැන්ත රැලි කිහිපයක් පැවැත්වීමටත්, මුළු රටම ආවරණය වන පරිදි නිවසින් නිවසට ගොස් ජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමටත් එහිදී තීන්දු විය. එය මාස 3ක පමණ කාලයක් පුරා එක දිගට පැවැත්වීමටත් එහිදී තීන්දු වී තිබිණි. එම රැලිවලට ජනාධිපතිවරයා සහභාගි වන්නේ කෙසේද, පක්ෂ දෙකේ නායකයන් සහභාගි වන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් ඉදිරි දිනවලදී යම් ඒකාබද්ධ කාලසටහනක් සකස් කිරීමටත් යෝජනා වී ඇති ආකාරයක් දැනගන්නට ඇත.

ආණ්ඩුව මෙසේ හිටිහැටියේම රට පුරා දේශපාලන රැලි පැවැත්වීමට ගනු ලැබූ තීන්දුව පසුපස ඇත්තේ කුමක්ද? ඉදිරියේදී පළාත් සභා මැතිවරණය පවත්වන ලෙසට උතුරු නැගෙනහිර සහ වතුකරයේ දෙමළ දේශපාලන පක්ෂවලින් දැඩි බලපෑමක් එල්ල වනු ඇති බවක් ජනාධිපතිවරයාට දැනී ඇති නිසාද?

පළාත් සභා මැතිවරණය පැවැත්වීම කල්දමා ගැනීම සඳහා ආණ්ඩුව පැත්තෙන් තේරීම් කාරකසභා පත්කිරීම වැනි විවිධ දේශපාලන උපායමාර්ග ක්‍රියාත්මක කළද, ඒවා වැඩි කල් ඇදගෙන යා නොහැකි බව ආණ්ඩුව විසින් වටහාගෙන ඇති බව අප මීට පෙර මෙම තීරයෙන් වාර්තා කිරීමට කටයුතු කළෙමු. එම නිසා කුමන හෝ ප්‍රබල පාර්ශ්වයකින් පළාත් සභා මැතිවරණය පවත්වන ලෙසට බලපෑම් එල්ල කිරීමේ අවදානම පිටතට නොපෙන්වා ජනාධිපතිවරයා දැන් තියාම ඊට සූදානම් වන ආකාරයක් මේ සිදුවීම් පසුපස ඇතිද යන්න සම්බන්ධයෙන් බොහෝ දෙනාට විශාල සැකයක් මතුව ඇති ආකාරයක්ද දැකගැනීමට පුළුවන.

## ප්‍රංශ ගමන කැන්සල්

**මේ අතරවාරයේ මිගමු බන්ධනාගාරයේ ගැටුම මුල් කරගෙන බොහෝ දෙනාගේ අවධානයෙන් ගිලිහුණු තවත් ප්‍රධාන මාතෘකාවක්ද පසුගිය සතියේ විවිධ පාර්ශ්ව අතර සාකච්ඡාවට ලක්වී තිබිණි. ඒ, ජනාධිපතිවරයාගේ ප්‍රංශ සංචාරයය. එම සංචාරය පසුගිය 13 වැනි දින සිදුකිරීමට නියමිතව තිබුණත්, කිසිදු හේතුවක් නොදක්වා හදිසියේම එය අත්හිටුවූ ආකාරයක් දැකගන්නට ලැබිණි. මේ සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ සාකච්ඡා නොවුණත්, බොහෝ දෙනා තුළ ඊට බලපෑ හේතු සම්බන්ධයෙන් විශාල කුතුහලයක් මතුව තිබූ ආකාරයක් පසුගිය සතියේදී දැකගන්නට ලැබිණි.**

ජනාධිපතිවරයාගේ මෙම ප්‍රංශ ගමන තීන්දු වූයේ නවදිල්ලියේ පැවැති රැස්වීමක් අතරතුරේදීය. එහිදී ජනාධිපතිවරයාට ප්‍රංශ ජනාධිපති එම්මානුවෙල් මැක්‍රෝන් මහතා හමුවූ අවස්ථාවේදී ප්‍රංශයේ සංචාරයක නිරත වන ලෙස ආරාධනා කිරීමටද කටයුතු කොට තිබිණි. ඒ අනුව ජනාධිපතිවරයාද සිටියේ ප්‍රංශයේ සංචාරය කිරීමට බොහෝ කැමැත්තෙනි. ජනාධිපතිවරයා එම ප්‍රංශ සංචාරයට කෙතරම් උනන්දු වූවාද කියනවා නම් එතෙක් ප්‍රංශයේ වැඩ බලමින් සිටි ශ්‍රී ලංකා තානාපතිවරයා වෙනුවට විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ස්ථිර තානාපතිවරයකු ලහිලහියේ පත්කිරීමටද ජනාධිපතිවරයා පියවර ගෙන තිබිණි.

නමුත් ජනාධිපතිවරයාද ඉතා කැමැත්තෙන් පසුවූ මෙම ප්‍රංශ සංචාරය හදිසියේම අවලංගු වූයේ ඇයි?

මේ දක්වා ඒ සම්බන්ධයෙන් නිල ප්‍රකාශයක් ජනාධිපතිවරයාගේ පාර්ශ්වයෙන් හෝ විදේශ කටයුතු අමාත්‍යාංශය පාර්ශ්වයෙන් හෝ ප්‍රංශ රජය පාර්ශ්වයෙන් හෝ සිදුවී ඇති ආකාරයක් දැකගන්නට නැත. නමුත් විදේශ ඇමැති විජිත හේරත් උපුටා දක්වමින් හදිසි කටයුතු කිහිපයක් මුල්කරගෙන ජනාධිපතිවරයාගේ මෙම ප්‍රංශ සංචාරයේ දින වකවානු වෙනස් කිරීමට සිදුව ඇති බවටත්, එම සංචාරය ඉදිරි දිනකදී සිදුවනු ඇති බවටත් විදෙස් මාධ්‍ය සඳහන් කොට තිබුණි.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් අප කළ සොයාබැලීමකදී යම් යම් පාර්ශ්වයන් ජනාධිපතිවරයාගේ ප්‍රංශ සංචාරය අවලංගු වීම සම්බන්ධයෙන් සැකසංකා කිහිපයක්ම මතුකොට තිබුණු ආකාරය දැකගන්නට ලැබිණි. ඉන් එක් සැකයක් වී ඇත්තේ ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මහතා විසින් ඉරානයට යළි ප්‍රහාර එල්ල කිරීම මීට එක් හේතුවක් වී ඇති බවකි.



කපිල පුංචිමාන්නගේ
රාජ්‍ය රහස්

# විපක්ෂයම අරන් සජිත් මහපාරට

ඇමෙරිකා ඉරාන යුද්ධය යළි ආරම්භ වීමත් සමග ප්‍රංශයද මේ වනවිට සිටින්නේ දැඩි අර්බුදයකට ලක්වය. ඒ අනුව ප්‍රංශ ජනාධිපතිවරයා විසින් මෙම හමුව අවලංගු කොට වෙනත් දිනයක් ලබාදීමට තීරණය කොට ඇති බවක් එක් ආරංචි මාර්ගයකින් පැවැසේ.

තවත් ආරංචි මාර්ගයක් කියන්නේ පිටතට නොපෙනුණාට මීගමු බන්ධනාගාරය තුළ සිදුවූ බරපතළ සිදුවීම ජනාධිපතිවරයාගේ ප්‍රංශ සංචාරය අවලංගු වීම සඳහා තවත් හේතුවක් වී ඇති බවකි. වැඩි ප්‍රසිද්ධියක් නොලැබුණාට මීගමුව බන්ධනාගාරය තුළ සිදුවූ ඝාතන සම්බන්ධයෙන් යුරෝපා කොමිසම මේ වනවිට ලංකාවේ පාර්ශ්වයන් විශාල වශයෙන් ප්‍රශ්න කිරීම්වලට ලක්කොට ඇති ආකාරයක් වාර්තා වේ. දැනටමත් යුරෝපා කොමිසම ආණ්ඩුවට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්වයන්ගෙන් ඒ පිළිබඳ බරපතළ විමසුම් සිදුකොට ඇති ආකාරයක්ද දැනගන්නට ඇත. එමෙන්ම ඊට අදාළ වාර්තාද ඔවුන් ලංකාව පාර්ශ්වයෙන් ඉල්ලා ඇති ආකාරයක්ද දැනගන්නට තිබේ.

බොහෝ දෙනා සඳහන් කරන්නේ යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවට ලබාදී ඇති ජී.එස්.පී. ප්ලස් සහනය සඳහා මීගමුව බන්ධනාගාරයේ ගැටුම ඉතා අහිතකර ආකාරයට බලපානු ඇති බවකි. ජී.එස්.පී. ප්ලස් සහනය යුරෝපා කොමිසම මගින් ලංකාවට ලබාදී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම මතය. මෙම සහනය ලබන මාර්තු මාසයේදී අවසන් වීමට නියමිතව ඇති අතර, එය යළිත් දීර්ඝ කරගැනීම සඳහා දැනටමත් ලංකාව යුරෝපා කොමිසම සමග අලුත් සාකච්ඡා වටයක් ආරම්භ කොට ඇති ආකාරයක්ද දැකගැනීමට පුළුවන. නමුත්, යුරෝපා කොමිසම මේ වනවිටත් දැනුම් දී ඇත්තේ මීගමුව බන්ධනාගාරයේ සිද්ධියේදී බැලූ බැල්මටම ඉතා ආකාරයක්ද දැකගැනීමට පුළුවන. නමුත්, යුරෝපා කොමිසම මේ වනවිටත් දැනුම් දී ඇත්තේ මීගමුව බන්ධනාගාරයේ සිද්ධියේදී බැලූ බැල්මටම ඉතා බරපතළ ලෙස මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සිදුව ඇති බවකි. එම නිසා දැනටමත් බොහෝ පාර්ශ්වයන්ගෙන් ජී.එස්.පී. ප්ලස් සහනය ලංකාවට ලබා නොදෙන ලෙස යුරෝපා කොමිසමට බලපෑම් එල්ල වී ඇති ආකාරයක්ද වාර්තා වේ.

මීට අමතරව ලබන සැප්තැම්බර් මාසයේදී ජිනීවා මානව හිමිකම් කොමිසම් රැස්වීමේදීද මෙම මීගමුව බන්ධනාගාරයේ ප්‍රශ්නය බරපතළ ලෙස සාකච්ඡා වීමට නියමිතව ඇති බවක් විශ්වාසකටයුතු ආරංචි මාර්ගවලින් 'රාජ්‍ය රහස්' තීරය වෙත දැනගන්නට තිබේ. එහිදී ප්‍රබල රටවල් රැසක්ම මීගමු බන්ධනාගාර සිද්ධිය මුල්කරගෙන ලංකාවට එරෙහි යෝජනාවක් ගෙන ඒමට උත්සාහ දරමින් සිටින ආකාරයක්ද මේ වනවිට දැකගන්නට ඇත. මෙම සිදුවීම්ද ජනාධිපතිවරයාගේ ප්‍රංශ සංචාරය හදිසියේම කල්දැමීමට හේතු වූ බවක් බොහෝ දෙනාගේ අදහස වී තිබේ. නමුත් තවමත් ඒ සම්බන්ධයෙන් කිසිදු පාර්ශ්වයකින් නිල ප්‍රකාශයක් සිදුව නැති නිසා බොහෝ දෙනා තුළ ඒ සම්බන්ධයෙන් විශාල කුතුහලයක් මතුව ඇති ආකාරයක් දැකගැනීමට පුළුවන.

## 65ම විරුද්ධයි

**පසුගිය සතියේ 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ ආණ්ඩුව සිදුකිරීමට යන අගවිනිසුරු ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස් සීමාව වසර 2කින් දීර්ඝ කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාවට එරෙහිව අධිකරණ ක්ෂේත්‍රය තුළින්ම එල්ල වී ඇති විරෝධය සම්බන්ධයෙන් විශේෂ තොරතුරු රැසක් අනාවරණ කිරීමට අපි පියවර ගත්තෙමු.**

එහිදී අප කියා සිටියේ ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ආසියානු නීතිඥ සංගමය, පොදුරාජ්‍ය මණ්ඩලීයීය නීතිඥ සංගමය, මහෙස්ත්‍රාත් අධිකරණ, මහාධිකරණ නීතිඥ සංගම් ඊට ප්‍රසිද්ධියේම විරෝධය පළකොට ඇති බවත්, අධිකරණ විනිසුරුවන්ගේ නියෝජිතත්වයෙන් යුත් අධිකරණ සේවා සංගමයේ මහාසභා රැස්වීම ලබන 18 වැනිදා පැවැත්වීමට නියමිතව ඇති බවත්, එහිදී මේ සම්බන්ධයෙන් ගනු ලබන තීන්දුව පිළිබඳ ක්ෂේත්‍රයේ බොහෝ දෙනාගේ දැඩි අවධානය යොමුව ඇති බවත්ය. මෙම අධිකරණ සේවා සංගමයට මහෙස්ත්‍රාත් අධිකරණවල විනිසුරුවරුන් සහ දිසා අධිකරණවල විනිසුරුවරුන් අන්තර්ගත වන බවද අපි එහිදී සඳහන් කර සිටියෙමු.

කෙසේ වෙතත් මෙහිදී අපට යම් අත්වැරැදීමක් සිදුව තිබිණ. ඒ, එම මහාසභා රැස්වීම පවත්වන දිනය වශයෙන් 18 වැනි සෙනසුරාදා සඳහන් කර තිබීමය. නමුත් සැබැවින්ම එය පැවැතියේ පසුගිය සතියේ 11 වැනි සෙනසුරාදාය.

ඒ අනුව අප අනාවරණ කළ පරිදිම මෙම අධිකරණ සේවා සංගමයේ මහාසභා රැස්වීම අතිශය තීරණාත්මක එකක් මෙන්ම අතිශය ආන්දෝලනාත්මක එකක්ද විය. ඊට හේතු වූයේ මහාසභා රැස්වීම පැවැත්වීමට පැය 24ක් තබා එහි සභාපතිවරයා වශයෙන් කටයුතු කළ විනිසුරු පසන් අමරසේන මහතා ලිපියක් ලියා තබමින් තමන් එම ධුරයෙන් ඉවත් වන බවට දැනුම් දී සිටීමය. නමුත් සභාපති විනිසුරුවරයා ඉවත් වුවද, ලේකම් විනිසුරුවරයාගේ මූලිකත්වයෙන් කලින් තීන්දු කරගත් පරිදි සෙනසුරාදා පැවැති මහාසභා රැස්වීමට නියෝජිතයන් 65 දෙනකු සහභාගි වී සිටි ආකාරයක් දැකගත හැකි විය. එහිදී දැකගන්නට ලැබුණු විශේෂම සිදුවීම වූයේ රැස්ව සිටි මෙම සාමාජිකයන් 65 දෙනාම උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස් සීමාව දීර්ඝ කිරීමේ ආණ්ඩුවේ යෝජනාවට ඒකමතිකව විරෝධය පළකොට තිබීමය. එම පුවතට සෙනසුරාදා දිනයේදීම විශාල ප්‍රසිද්ධියක් ලැබුණු ආකාරයක්ද සියල්ලන්ටම දැකගන්නට හැකි විය. එමෙන්ම බොහෝ දෙනා එය හැඳින්වූයේ ආණ්ඩුව ලැබූ විශාල පසුබෑමක් ලෙසටය. එමෙන්ම අධිකරණ ක්ෂේත්‍රය තුළින්ම ආණ්ඩුවට එල්ල වූ විශාල පහරක් ලෙසටය.

## මුට්ටිය දාලා බැලුවාද?

**කෙසේ වෙතත් අධිකරණ සේවා සංගමයේ මහාසභා රැස්වීමේදී මෙවැනි තීන්දුවක් ගනු ඇති බවට කල්තියාම තොරතුරු ලැබී තිබීම නිසාදෝ සෙනසුරාදා දිනයේදීම නමක් ගමක් නොමැතිව කොහෙන්දෝ පළවූ පුවතකින් කියැවුණේ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ පමණක් නොව, සියලු විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ කාලය අවුරුදු 2කින් දීර්ඝ කිරීමට සැලසුම් කොට ඇති බවකි. බොහෝ දෙනා එම පුවත දුටු සැණින්ම කියා සිටියේ ඔන්න ආණ්ඩුව මුට්ටිය දාලා බලන්න පටන් අරන් යැයි කියාය. ඊට හේතු වූයේ එම පුවත කිසිදු නිල පිළිගත හැකි මූලාශ්‍රයකින් පළ වී නොතිබීම නිසාය.**

කෙසේ වෙතත් එම සිදුවීම හරහා එක් කරුණක් සිදුවිය. ඒ, උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව දීර්ඝ කිරීමට ආණ්ඩුව ගෙනගිය මෙහෙයුම යටපත් වූ ආකාරයක් දැකගන්නට ලැබීමය. ඊට හේතු වී තිබුණේ මේ වනවිට එය උපරිමාධිකරණ විනිසුරුවරුන්ට පමණක් සීමා නොවී සියලු අධිකරණ විනිසුරුවරුන්ට බලපාන පරිදි සිදුකිරීමට නියමිතව ඇති බවට සමාජ මාධ්‍ය මගින් පුවත් පළකොට තිබීමය.

## සජිත් සටනට බහී

**කෙසේ වෙතත් මේ සම්බන්ධ තවත් විශේෂ පුවතක් පළමු වරට අප 'රාජ්‍ය රහස්' තීරයෙන් හෙළිදරව් කිරීමට සූදානම්ය. ඒ, විනිසුරුවරුන්ගෙන් සමන්විත වූ අධිකරණ සේවා සංගමයේ මහාසභා රැස්වීමට දින කිහිපයකට පෙරාතුව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා කිසිදු ප්‍රසිද්ධියකින් තොරව මීට අදාළව සිදුකළ මෙහෙයුමක් පිළිබඳවය. ඒ අනුව කවදාවත් නොකළ ආකාරයට සජිත් මෙම උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමට ආණ්ඩුව ගෙන ඇති තීන්දුවට එරෙහිව සමස්ත විපක්ෂයම එකමුතු කිරීමේ මෙහෙයුමට පසුගිය සතියේ අත තිබ්බේය.**

මේ සම්බන්ධයෙන අප ඉකුත් සතියේ තවත් කරුණක් අනාවරණ කරමින් කියා සිටියේ පොහොට්ටුවේ ජාතික සංවිධායකවරයා වශයෙන් නාමල් රාජපක්ෂ මහතාද මේ සම්බන්ධයෙන් තොරතුරු පැහැදිලි කරමින් සජිත්ට ලිපියක් එවා තිබූ බවකි.

ඒ අනුව සජිත් පසුගිය සතියේ විපක්ෂයේ පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ නායකයන්ට පමණක් නොව, පාර්ලිමේන්තුව නියෝජනය නොකරන පක්ෂ නායකයන්ටද පෞද්ගලිකවම දුරකතන ඇමතුම් ලබාදෙමින් මේ සම්බන්ධයෙන් අලුත් සාකච්ඡා වටයක් ආරම්භ කිරීමට පියවර ගත්තේය. ඒ අනුව මුලින්ම සජිත් කතා කළේ රවුෆ් හකීම්, රිෂාඩ් බදියුදීන්, මනෝ ගනේෂන්, පලනි දිගම්බරම් සහ එම්.ඒ. සුමන්තිරන් යන පක්ෂ නායකයන්ටය. ඉන් අනතුරුව අර්චුනා රාමනාදන්, ගජේන්ද්‍රන් පොන්නම්බලම් සහ ඩග්ලස් දේවානන්දා යන මහත්වරුන්ටද සජිත් දුරකතන ඇමතුම් ලබාදීමට පියවර ගත්තේය. එපමණක් නොව, සිලින්ඩරය නියෝජනය කරමින් පාර්ලිමේන්තු පැමිණි චාමර සම්පත් දසනායකටද සජිත් මේ සම්බන්ධයෙන් කතා කළේය. එහිදී දැකගන්නට ලැබුණු විශේෂම සිදුවීම වූයේ එජාප නායක රනිල් වික්‍රමසිංහට සහ පොහොට්ටුවේ ජාතික සංවිධායක නාමල් රාජපක්ෂටද දුරකතන ඇමතුම් ලබාදෙමින් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට සජිත් පියවර ගැනීමය.

මෙම සාකච්ඡාවේදී ආණ්ඩුව ගෙන යන මෙම වැඩපිළිවෙළ පරාජයට පත්කිරීම සඳහා ඒකාබද්ධ වැඩපිළිවෙළක අවශ්‍යතාව පෙන්වා දුන් සජිත්, ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් සාකච්ඡා කිරීම සඳහා ලබන 23 වැනිදා විපක්ෂ නයක කාර්යාලයේදී විශේෂ සාකච්ඡාවක් සංවිධාන කොට ඇති බවත්, ඊට සහභාගි වන ලෙසත් සියලු දෙනාට දැනුම්දී සිටියේය. සාකච්ඡාවට එක්වූ සියලු දෙනාගෙන්ම ඊට පළවූයේ යහපත් ප්‍රතිචාරයකි.

අධිකරණ සේවා සංගමයේ තීන්දුව ආවේද සජිත් මේ ආකාරයට විපක්ෂයේ සියලු පක්ෂ නායකයන්ට දුරකතන ඇමතුම් ලබාදෙමින් සිටි අතරවාරයේය. ආණ්ඩුව අධිකරණ සේවා සංගමයේ තීන්දුවෙන් තිගැස්මකට ලක්වූවාද එසේත් නැත්නම් විපක්ෂයේ සියලු පක්ෂ ආණ්ඩුවේ මෙම තීන්දුවට එරෙහිව ඒකාබද්ධ කිරීමට සජිත් ගෙන යන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් තිගැස්මකට ලක්වූවාද යන්න පැහැදිලි නැතත්, උපරිමාධිකරණ විනිසුරුවරුන්ට පමණක් සිදුකිරීමට නියමිතව තිබූ විශ්‍රාම වයස් සීමාව දීර්ඝ කිරීම සියලු විනිසුරුවරුන්ට බලපාන පරිදි දීර්ඝ කරන බවට වූ පුවත කරළියට පැමිණියේ ඉන් පසුවය.

කෙසේ වෙතත් තවමත් ආණ්ඩුව පැත්තෙන් හෝ ජනාධිපතිවරයාගේ පැත්තෙන් මේ සම්බන්ධයෙන් කිසිදු නිල ප්‍රකාශයක් නිකුත් වී නොමැත. කැබිනට් මාධ්‍ය හමුවේදී පවා ප්‍රකාශයට පත්වූයේ මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේදී සාකච්ඡාවක් සිදුවූ බව පමණි. ඒ අනුව අපද මේ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ ප්‍රතිචාරය කුමක්ද යන්න පිළිබඳ කිසියම් සොයාබැලීමක නිරත වීමු. ඒ අනුව අපට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ ජනාධිපතිවරයාද අඩියක් පසුපසට ගෙන උපරිමාධිකරණ විනිසුරුවරුන්ට පමණක් නොව සියලු විනිසුරුවරුන්ට බලපාන පරිදි විශ්‍රාම වයස් සීමාව දීර්ඝ කිරීමට එකඟතාව පළකොට ඇති බවකි. එය ඉදිරියේදී පාර්ලිමේන්තුව හරහා යෝජනා සම්මතයකින් සිදුකිරීමට සූදානමින් සිටින බවද දැනගන්නට ඇත.

## මහින්ද එනවා

**හිටපු විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිර්ගාමර් මහතාගෙන් පසු මෑත කාලයේ ලංකාවේ බිහිවූ විශිෂ්ටතම රාජ්‍යතාන්ත්‍රිකයා කවුරුන්ද යන්න පිළිබඳ කිසිවකු විමසුවහොත් කිසිදු පැකිලීමකින් තොරව දේශපාලනය ගැන දන්නා කියන සියලු දෙනාම පිළිතුරු දෙනු ඇත්තේ මහින්ද සමරසිංහ මහතා යැයි කියාය. මන්ද, ඒ තරමටම කදිර්ගාමර් මහතා මෙන්ම මහින්ද සමරසිංහද ලංකාව මුල්කරගෙන ජාත්‍යන්තර දේශපාලනයේ තැන් කිහිපයකදීම නොමැකෙන ලෙස සිය නම තැබූ දේශපාලනඥයෙක් වීම නිසාය.**

2009 යුද ජයග්‍රහණයෙන් පසුව ජිනීවා මානව හිමිකම් කොමිසමට ලංකාව සම්බන්ධයෙන් යුද අපරාධ චෝදනාවක් එල්ල වූ අවස්ථාවේදී ඉතිහාසයේ පළමු වතාවට සියලු රටවල් එකමුතු කොටගෙන ඡන්දයකට ගොස් එම යෝජනාව පරාජයට පත්කිරීමට මහින්ද සමරසිංහ සමත් විය. ඉන් අනතුරුව ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ආණ්ඩු කාලයේ විදේශ අමාත්‍යවරයා වශයෙන් රාජකාරි කළ මහින්ද සමරසිංහ පසුව ඉන් ඉවත් වී ඇමෙරිකාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස කටයුතු කිරීමට පියවර ගත්තේය.

එසමයේදී කොරෝනා වසංගතයෙන් ලංකාව බරපතළ අර්බුදයකට ලක්වෙද්දීත්, පසුව ආර්ථික අර්බුදය හේතුවෙන් රට බංකොලොත් වෙද්දීත් ඇමෙරිකානු තානාපතිවරයා වශයෙන් මහින්ද සමරසිංහ අමෙරිකාවෙන් විශාල ආධාර ප්‍රමාණයක් ලංකාවට රැගෙන ඒමට සමත් විය. ඒ දැක්වූ දක්ෂතාව නිසාම ගෝඨාගෙන් පසු බලයට පත්වූ රනිල් වික්‍රමසිංහ මහතාද මහින්ද සමරසිංහව ඇමෙරිකානු තානාපති ධුරයේ තැබීමට පියවර ගත්තේය.

ඉන් අනතුරුව අනුර කුමාර දිසානායක මහතා බලයට පත්වීමෙන් පසු බොහෝ දෙනා සිතා සිටියේ මහින්ද සමරසිංහටද ඇමෙරිකානු තානාපති ධුරයට ආයුබෝවන් කීමට සිදුවනු ඇතැයි කියාය. අනුර සියලු තානාපතිවරුන් නැවත මෙරටට කැඳවීමට පියවර ගත්තද, තවදුරටත් සේවයේ තබාගත් අතළොස්සක් දෙනා අතර මහින්ද සමරසිංහද ඉදිරියෙන් සිටියේය. ජවිපෙ වාමාංශික පක්ෂයක් බැවින් බොහෝ දෙනා ලංකාව, චීනය සහ රුසියාව සමග සබඳතා තර කරගනු ඇති බව සිතා සිටියත්, මහින්ද සමරසිංහ ඒ සියල්ල හිතලු බවට පත්කරමින් ඇමෙරිකාව සහ අනුරගේ වමේ ආණ්ඩුව අතර ඉතා සමීප සබඳතාවක් ඇතිකරලීමට මූලිකත්වය ගත්තේය. ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ළඟම හිතවතා වූ දකුණු හා මධ්‍යම ආසියානු කලාප භාර රාජ්‍ය ලේකම් සර්ජියෝ ගෝර් සහ ජනාධිපතිවරයා අතර අතිශය සමීප සබඳතාවක් ඇතිකරලීමට මහින්ද සමරසිංහ පියවර ගත්තේය. එමෙන්ම පසුගිය කාලයේදී ට්‍රම්ප් පරිපාලනය ලංකාව ඉලක්ක කරගෙන තීරුබදු පැනවූ අවස්ථාවේදී එය 44% සිට 19% දක්වා අඩුකර ගැනීමට මහින්ද සමරසිංහ පියවර ගත්තේය. එමෙන්ම ඇමෙරිකාවෙන් වෙරළාරක්ෂක හෙලිකොප්ටර් යානා සහ නෞකා රැසක් ඇමෙරිකාවෙන් ලංකාවට ලබාදීමට මහින්ද සමරසිංහ මූලිකත්වය ගත්තේය.

කෙසේ වෙතත් මේ ආකාරයේ දැවැන්ත වැඩකොටසක් ලංකාව වෙනුවෙන් සිදුකළද, තනතුරෙන් ඉවත් වීම සඳහා තවත් කාලයක් තිබුණද මහින්ද සමරසිංහ තීරණය කොට තිබුණේ මෙම මස අවසන් වනවිට සිය ධුරයෙන් විශ්‍රාම යෑමටය. මේ බව පළමුවෙන්ම රටට හෙළිදරව් කිරීමට කටයුතු කළේ 'රාජ්‍ය රහස්' තීරයය.

කෙසේ වෙතත් මහින්ද සමරසිංහ ඇමෙරිකානු තානාපති ධුරය දරද්දී එරට සියලු බෞද්ධ විහාරස්ථානවලට සහ භික්ෂූන් වහන්සේලාට විශාල වශයෙන් උපකාර කළ අයෙකු ලෙස ප්‍රකටය. මේ හේතුව නිසා මහින්දගේ විශ්‍රාම යෑම වාර්තා වීමත් සමග වොෂින්ටන් ඩීසී ප්‍රදේශයේ සහ කැලිෆෝනියාවේ බෞද්ධ විහාරස්ථාන සියල්ල නියෝජනය කරමින් මහා සංඝරත්නය පසුගිය සෙනසුරාදා දිනයේදී මහින්ද සමරසිංහ මහතාට උපහාර උත්සවයක් සංවිධාන කිරීමට පියවර ගෙන තිබිණි. ඒ, වොෂින්ටන් බෞද්ධ විහාරයේදීය. මෙම වොෂින්ටන් බෞද්ධ විහාරය ලංකාවේ ප්‍රකට හිමිනමක් වූ පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ හිමියන් විසින් ආරම්භ කරන ලද්දකි. එක්සත් ජනපදයෙන් පිටව යන ශ්‍රී ලංකා තානාපතිවරයෙකුගේ සේවයට උපහාර දැක්වීම සඳහා මෙම අගනගර ප්‍රදේශයෙන් සහ ඉන් ඔබ්බට ව්‍යාප්තව සිටින පූජ්‍ය මහා සංඝරත්නය එක්රැස් වූ පළමු අවස්ථාව මෙය විය. රැස්ව සිටි පිරිස ඇමතූ තානාපති සමරසිංහ මහතා, වොෂින්ටන් ඩී.සී.හි තම සේවා කාලය තුළ ලැබූ අත්දැකීම් සහ තමා මුහුණ දුන් අභියෝග බෙදා ගත් අතර, තම රාජකාරි සාර්ථකව ඉටු කිරීමේදී මහා සංඝරත්නය සහ ශ්‍රී ලාංකික ප්‍රජාව දැක්වූ සහයෝගය අගය කළේය. සිය මාතෘ භූමිය වෙනුවෙන් සිය සේවය

> 'ඉන් අනතුරුව අනුර කුමාර දිසානායක මහතා බලයට පත්වීමෙන් පසු බොහෝ දෙනා සිතා සිටියේ මහින්ද සමරසිංහටද ඇමෙරිකානු තානාපති ධුරයට ආයුබෝවන් කීමට සිදුවනු ඇතැයි කියාය.අනුර සියලු තානාපතිවරුන් නැවත මෙරටට කැඳවීමට පියවර ගත්තද, තවදුරටත් සේවයේ තබාගත් අතළොස්සක් දෙනා අතර මහින්ද සමරසිංහද ඉදිරියෙන් සිටියේය.

> 'එමෙන්ම පසුගිය කාලයේදී ට්‍රම්ප් පරිපාලනය ලංකාව ඉලක්ක කරගෙන තීරුබදු පැනවූ අවස්ථාවේදී එය 44% සිට 19% දක්වා අඩුකර ගැනීමට මහින්ද සමරසිංහ පියවර ගත්තේය. එමෙන්ම ඇමෙරිකාවෙන් වෙරළාරක්ෂක හෙලිකොප්ටර් යානා සහ නෞකා රැසක් ඇමෙරිකාවෙන් ලංකාවට ලබාදීමට මහින්ද සමරසිංහ මූලිකත්වය ගත්තේය.

කපිල පුංචිමාන්නගේ

PAGE - 08

# තිස්එක් වසරක AIA පොසොන් රැකවරණය වඩාත් ශක්තිමත්වෙයි

මෙවර පොසොන් සමයේ වන්දනාවේ ගිය සියලු දෙනාගේ ජීවිතය සුරක්ෂිත කරන්නට තිස්එක් වසරක AIA පොසොන් රැකවරණය, වඩාත් ශක්තිමත්ව සහ වෙනදාටත් වඩා හෘදයාංගම ලෙස සේවාවන් රැසක් සමගින් ක්‍රියාත්මක වී තිබුණා.

1993 වසරේ පොසොන් සමයේ ආරම්භ කරන ලද මෙම වැඩසටහනේ අරමුණ වූයේ අනුරාධපුර පූජා නගරය කරා දිවයිනේ නන්දෙසින් වන්දනාවේ පැමිණෙන ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් පූජා නගරය වටා ඇති වැව් සහ නොයෙකුත් නාන තොටුපළවල්හි දී



සිදුවිය හැකි අනතුරු වළක්වාලමින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව තහවුරු කරලීමයි.

AIA ඉන්ෂුවරන්ස් ලංකා සමාගම මෙවරත් මෙම රැකවරණ වැඩසටහන ඔස්සේ අවධාරණය කර සිටියේ වන්දනාවේ ආ බැතිමතුන් වතුරට බැසිය යුත්තේ නෑමට සුදුසු බවට සඳහන් කර ඇති ආරක්ෂක පුවරු හෝ ජීවිත ආරක්ෂක නිලධාරීන් සිටින තැන්වලින්ම පමණක් බවයි.

මේ වසරේ ද ජූනි 28, 29 සහ 30 යන දිනයන්හි දී, දඹුල්ල, අනුරාධපුරය, පොළොන්නරුව, දිඹුලාගල, තන්තිරිමලේ, මිහින්තලේ යන ප්‍රදේශවල වැව් සහ ජලාශ 44ක් ආවරණය කරමින් ජීවිත ආරක්ෂක නිලධාරීන් 530 කට අධික ප්‍රමාණයක් බැතිමතුන්ගේ ජීවිත ආරක්ෂා කිරීම වෙනුවෙන් කැප වී සිටියා.

ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් ජීවිතාරක්ෂකයින් අනුයුක්ත කරගනිමින් AIA ආරම්භ කළ මෙම මනුෂ්‍යත්වයේ සේවාවට කැපවෙමින් ගෙවී ගිය වසර 31 පුරා මෙම රැකවරණ වැඩසටහන ඔස්සේ බේරා ගත්, දියේ ගිලුණු ජීවිත සංඛ්‍යාව 250 කට අධිකයි. එම මහඟු සේවාවට කෘතගුණ සැලකීමක් ලෙස බැතිමතුන්ගේ වටිනා ජීවිත බේරාගත් ජීවිතාරක්ෂක නිලධාරීන්ගේ ජීවිතද, හදිසි අනතුරු රක්ෂණාවරණයකින් සුරක්ෂිත කරලීමට AIA ඉන්ෂුවරන්ස් විසින් මෙවර කටයුතු කර තිබුණා.

මෙවර විශේෂ සේවාවක් ලෙස බැතිමතුන්හට නිදහසේ වන්දනාවේ යාම සඳහා කොළඹ සිට අනුරාධපුරයට නොමිලේ දිවෙන AIA පොසොන් වන්දනා දුම්රිය සේවාව ද, අනුරාධපුර සහ මිහින්තලය අතර දින 3ක් පුරා නොමිලයේ දිවෙන සම්බන්ධක දුම්රිය සේවාවක් ද ක්‍රියාත්මක කර තිබුණා.

එමෙන්ම, ශ්‍රී ලංකාවේ මිනිස් ජීවිතවලට බලපාන නිහඬ මාරයන් වන අධිරුධිර පීඩනය පිළිබඳ පරීක්ෂාවන් කොළඹ වෛද්‍ය විද්‍යාලයේ සහාය ඇතිව සිදුකිරීමටත්, මුඛ පිළිකා ගැන දැනුවත් කිරීම් සහ පරීක්ෂාවන් ශ්‍රී ලංකා පිළිකා සංගමයේ සහාය ඇතිව පූජා නගරය තුළ සිදුකිරීමට කටයුතු යොදා තිබුණු අතර බැතිමතුන්ගේ සුවපත්, සැපවත්, දිගුකල් ජීවිතයක වගකීම පෙරදැරිව පුදබිම අවට පරිසරය පිරිසුදු කිරීමේ වැඩසටහනක්ද AIA මෙවර ක්‍රියාත්මක කර තිබුණා. ඒ වගේම ආරක්ෂක අමාත්‍යාංශය හා එක්ව පුදබිම තුළ බැතිමතුන්හට මග පෙන්වන ජංගම දුරකතනය මගින් posonvandana.lk ඔස්සේ පිවිසීමේ හැකියාව ඇති ඩිජිටල් සිතියමක් ද ක්‍රියාත්මක කර තිබූ අතර මෙවර බැතිමතුන්ට එය අලුත් අත්දැකීමක් වූ බව නොඅනුමානයි.

මේ සිතියම ඔස්සේ, වාහන නැවැත්වීමේ ස්ථාන, පානීය ජල ස්ථාන, වැසිකිළි පහසුකම්, දන්සල්, ආරක්ෂිතව දිය නාන ස්ථාන සහ සෞඛ්‍ය කඳවුරු, හදිසි ඇමතුම් අංක ආදී වන්දනාකරුවන්හට අත්‍යාවශ්‍ය තොරතුරු සියල්ල සඳහා විමසීමට හැකියාව සලසා තිබුණා.

මෙවරත් AIA පොසොන් රැකවරණ වැඩසටහන යටතේ දිය අනතුරට පත් වටිනා මිනිස් ජීවිත 06ක් බේරා ගැනීමට ජීවිතාරක්ෂක නිලධාරීන් සමත්ව තිබූ අතර AIA ඉන්ෂුවරන්ස් තවදුරටත් ජනතාවට සුවපත්, සැපවත්, දිගුකල් ජීවිත ළඟා කරගැනීම සඳහා සහාය වීමට කැපව සිටින බවට මේ සියලු දේ ඔස්සේ මනාව පිළිබිඹු වෙනවා.

# හිරවෙන්නෙ නැතුව හිරේ ගැන දැනගන්න

**බන්ධනාගාරයේ ගැටුම ඉවරද? ලියුම්කරු විශ්වාස කරන විදිහට බන්ධනාගාරයේ ගැටුම තවමත් ඉවර නැහැ. එතකොට බන්ධනාගාරයේ ගැටුම පටන් අරගත්තේ කවද්ද? බන්ධනාගාරයේ ගැටුම පටන් අරගත්තේ ජූලි 06 වැනිදා කියලයි අපි සාමාන්‍යයෙන් දන්නේ. එහෙමත් නැත්නම් ජූලි 06 වැනිදා රාත්‍රියේ. ලියුම්කරු විශ්වාස කරන විදිහට මේ ගැටුම පටන් අරගත්තේ ජූලි මාසේ 06 වැනිදා නෙමෙයි. මේ ගැටුම පටන් අරගත්තේ 1853දී. ඒ, කොළඹ වැලිකඩ බන්ධනාගාරය පිහිටුවපු දවසේ. සමහර ලේඛනවලට අනුව ලංකාවේ ප්‍රථම බන්ධනාගාරය 1841 පටන් අරගත්තා කියලා කියනවා. කොහොම හරි කමක් නෑ මේ ගැටුම පටන් අරගන්නේ බන්ධනාගාරය ආරම්භ වූ දවසේ සිට.**

මේ ගැටුමට වගකියයුත්තෝ කවුද? මේ ගැටුමට වගකියයුත්තෝ මම සහ ඔබ. ඒ කියන්නේ ලියුම්කරු වන මම, ලිපිය සංස්කරණය කරන අය, අපේ මාධ්‍ය ආයතනයේ ඉන්න ප්‍රධානීන්, පිටු සැකසුම් ශිල්පීන් ඇතුළු සියලු පුරවැසියන්. ඒකට හේතුව මොකක්ද? මේ ලංකාවේ බන්ධනාගාර පද්ධතිය ඉතාම දූෂිත බව ඉතාම නරක බව අපි දැනගෙන හිටියා. හැබැයි අපි ඒ ගැන කතා කළේ නැහැ. බන්ධනාගාරයේ රැඳවියන් ඉතා නරක ආකාරයෙන් සලකන බව අපි දැනගෙන හිටියා. අපි ඒ සම්බන්ධව ප්‍රශ්න කළේ නැහැ. බන්ධනාගාරය තුළට මත්කුඩු, මත්ද්‍රව්‍ය, අපි ආයුධ ඇතුළු සියලු දේ යන එන බව අපි දැනගෙන හිටියා. අපි ඒ ගැන අහලා තියෙනවා. මේ ලිපිය කියවන ඔබට මං ඒ කතාව මේ වෙලාවේ කිව්වා







## මීගමු ගැටුම පටන් ගත්තෙ කවද්ද?

කියලා කුතුහලයට පත්වෙන්නෑ. ඔබ පුදුම වෙන්නෙත් නෑ. ඔබට ඒක අරුමයක් නෙමෙයි. ඒකට හේතුව ඔබත් මමත් අප දෙදෙනාම මේ කතාව මීට කලින් දහස් වතාවක් අහලා තියෙනවා. ඇයි ඒක අහලා විතරක් තියෙන්නේ? මේ පිළිබඳ පියවර ගත හැකි බලධාරීන් ඇයි ඒ සම්බන්ධව කිසිදු පියවරක් නොගත්තේ? ලියුම්කරු වන මම පවා මේ පිළිබඳ කිසිදු දෙයක් කරන්නට පියවර නොගත්තේ සමාජ මාධ්‍යවල එවැනි දෙයක් ලියන්නේ නෑ. ලංකාවේ මාධ්‍ය ඇතුළේ අපි ලොකු හඬක් නගන්නේ නෑ. බලධාරීන්ට බලකරන්නේ නෑ. කවුරුත් බන්ධනාගාර පද්ධතිය නිවැරදි කරන බවට ඡන්ද පොරොන්දු දෙන්නේ නැහැ. බන්ධනාගාර ගතවූවන්ට නිසි සනීපාරක්ෂක පද්ධතියක්වත් අඩුම තරමින් ලබාදෙන බවට අපි කියන්නේ නැහැ.

සුරේෂ් සලෙයිගෙ ඉකිලි කසනවා කියලා ඒක හාස්‍යයට ලක් කරමින්, උපහාසයට ලක්කරමින් 'ඔහුට අපි බෙහෙත් දුන්නා' කියන එක කියන බලධාරීන් කිසිම දවසක මේ රෝග බෝවීම පාලනය කරන්න උපක්‍රම හදන්නේ නැහැ. බන්ධනාගාරය තුළ හිරවී තෙරපිලා මිනිස්සු මියයන බව දැන දැනත් අපි ඒකට පියවරක් ගන්නේ නෑ. බන්ධනාගාර වාට්ටු ප්‍රශ්න, ඒවායේ සිද්ධ වෙන පහරදීම්, ගැටුම් අපි දකිනවා සිනමාවේ. අපි දකිනවා ටෙලිනාට්‍යවල. අපි දකිනවා ඕනෙ තරම් එවැනි දේවල් සමාජයේ එළියේ කතා කරනවා. හැබැයි ඒවා නරක බව ඒවා නොවිය යුතු බව දැන දැනත් අපි කිසිවෙක් ඊට විරුද්ධව පියවරක් අරගෙන නැහැ. බන්ධනාගාරය තුළට යන පිරිමි පිරිමි අතින් දූෂණය වෙනවා, ගැහැනු ගැහැනු අතින් දූෂණය වෙනවා. ඒක අපි අහලා තියෙනවා. හැබැයි අපිට ප්‍රශ්නයක් නැහැ. ඒකට හේතුව තමයි අපේ කෙනෙක් බන්ධනාගාර ගියාම අපි ඔහු අතාරිනවා. අපේ කෙනෙක් බන්ධනාගාර ගිහිල්ලා නැත්නම් අපිට බන්ධනාගාරයෙන් ඇති වැඩක් නැහැ. බන්ධනාගාරගත වූවන්ට එළියට ඇහෙන්න කතාකරන්න බෑ. ඒ නිසා බන්ධනාගාරගත වූවන්ගේ හඬ අපිට ඇහෙන්නේ නෑ. බන්ධනාගාරයෙන් එළියට එන එකා එන්නේ බන්ධනාගාරය අතහැරලා දාලා. ඊට පස්සේ ඌට බන්ධනාගාරයේ උන්ගේ සැප සනීප ගැන වැඩක් නැහැ.

ඒ නිසා බන්ධනාගාර පද්ධතියේ මේ ගැටුම සිද්ධ වුණේ ජූලි මාසේ 06 වැනිදා කියලා කවුරුහරි ඔබට කියනවා නම් ඒ කියන්නේ පට්ටපල් බොරුවක්. මේ ගැටුම දවසින් දවස, මොහොතින් මොහොත, පැයෙන් පැය, තත්පරයෙන් තත්පරය නිර්මාණය වෙච්ච එකක්.

මේ වෙන්නේ බන්ධනාගාරය තුළ තිබිච්ච පීඩනය පුපුරා යාම. එක එක්කෙනා කියනවා වගේම මත්ද්‍රව්‍ය අරගෙන, මත්වෙලා, ඒ වෙලාවේ තරහා ගිහිල්ලා, දැක්කාම තරහා ගිහිල්ලා ඒ කිසි දෙයක් නෙමෙයි. බන්ධනාගාරය තුළ ඉන්න නිලධාරීන්, බන්ධනාගාරය තුළ ඉන්න රැඳවියන්, ඒ වගේම මේ බන්ධා පොලිස් කියන අය මේ හැමෝම මේ සිස්ටම් එක ඇතුළේ විවිධ චරිත නිරූපණය කරනවා. ඒගොල්ලෝ ගොඩ දෙනෙක් නිරූපණය කරන්නේ සුදු චරිතවලට වඩා කළු චරිත. ඒකට හේතුව බන්ධනාගාර ඇතුළේ වෙන දේවල් එළියේ ඉඳන් බලාගෙන ඉන්න කවුරුත් එන්නේ නැති නිසා. බන්ධනාගාරවලට ලොකු ඉබ්බෝ දාලා වහලා තියෙන හින්දා. බන්ධනාගාර ඇතුළේ තියෙන්නේ සැඟවුණු ජීවිත. අපි නොදන්නා කතන්දර ඕනෙ තරම් තියෙනවා.

අපි දකිනවා ආයුධ මල්ලක්. මේ ආයුධ මල්ලෙන් එක එක, එක දවසක ඇතුළට ගියත් මේ ටික ඇතුළට යන්න අවුරුද්දක්වත් යනවා. ඒ තරම් ආයුධ ගොඩක් තියෙනවා. බන්ධනාගාරය කාලය ඇතුළේදී දරුණු ලෙස ඔවුන්ට පහර දෙනවා. ඒ පහරදීම විනාඩියකින් දෙකකින් තුනකින් වෙච්ච එකක් නෙවෙයි, මේක පැය ගානක වැඩක්. එළියට පැනලා දුවගෙන ආවා නම්, පොලිසිය සාක්කි දෙන විදිහට, දුවගෙන ඇවිල්ලා මොකද කළේ? පොල් ගෑවද? ඇයි පොලීසියට කිව්වේ නැත්තේ? ඇයි හමුදාවට අවසර දුන්නේ නැත්තේ? ඇයි ඇතුළට කඳුළු ගෑස් ටිකක් ගැහුවේ නැත්තේ? හිර ගේ ඇතුළට තුවක්කුවක් දාලා වෙඩිතියන එකද මේ වෙලාවේ කරන්න ඕනේ? කැරලි මර්දන ඒකක තියෙනවා, කඳුළු ගෑස් තියෙනවා, වෙනත් උපක්‍රමික දේවල් කරන්න පුළුවන්කම තිබුණා. පොලිසියට වැඩේට අවසර දෙන්නේ උදේ දහයත් පහුවෙලා. හැබැයි මේ උදැසන මළ සිරුරු ටිකක් තමයි එළියට ගේන්න වෙන්නේ. ඇතුළේ ගහනවා නම් එළියට දුවගෙන ආපු මිනිස්සුන්ට තිබුණා පියවරක් ගන්න. ඒක බැරි වෙන්න හේතුව තමයි මේ සිස්ටම් එක ඇතුළේ මේ හැමෝම කොටස්කාරයෝ. මේ හැමෝටම මේ කතාවේ චරිත තියෙනවා.

බන්ධනාගාරය ඇතුළට යන බත් පාර්සලේ කුරු ගාලා බත් ඇටෙන් ඇටේ බලලා චෙක් කරනවා නම් මේක ඇතුළට ආයුධ යන්න විදිහක් නැහැ. මත්ද්‍රව්‍ය යන්න විදිහක් නැහැ. සරල දෙයක් කියන්නම්. පළමුවැනි සිදුවීම වෙන්නේ දෙකේ වාට්ටුව සහ එකොළහ වාට්ටුව අතර. කණ්ඩායම් දෙකක් අතර ගැටුමක් නිර්මාණය වෙනවා. නිකම් පහරදීමක් නෙවෙයි මැරෙනකම් ගහනවා. දෙන්නෙක් මැරෙනවා. මේ මැරුණු දෙන්නා මැරෙන්නේ කාගෙ වරදින්ද? එතකොට මේකට කවුද සම්බන්ධ වෙන්නේ? අපිද? නෑ. මේකට පැහැදිලිවම සම්බන්ධ වෙන්නේ පාර්ශ්ව දෙකයි. එක් පාර්ශ්වයක් රැඳවියෝ, අනිත් පාර්ශ්වය තමයි බන්ධනාගාර නිලධාරීන්. එතකොට මේ පාර්ශ්ව දෙක විසින් සමසමව බෙදාගත්තු අපරාධ රැල්ලක කොටස්කාරයෝ තමයි මේ ගැටුමට මූලික වෙන්නේ, මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ.

මේ හතළිස් දහසෙන් නරක නැති රැඳවියෝ විසි දහසකට වඩා ඇති. බන්ධනාගාර නිලධාරීන් අතරින් කිසිදු වරදක් නොකරන මිනිස්සු ඕනෙ තරම් ඇති. අර එක්කෙනෙක් කියන්නේ 'අපි වතුර උගුරක්වත් බොන්නේ නෑ' කියලා. ඒ කතාව ඇතුළේ පැහැදිලි වෙනවා ඔහු කියන විදිහට 'අපි බොන්නේ නෑ', 'අපි බොන්නේ නෑ' කියලා ඔහු කියන්නේ බොන අය ඉන්න නිසා. ඇත්තටම බොන අය ඉන්නවා. මේක ඇතුළේ වරප්‍රසාද විඳින අය ඉන්නවා. මේක ඇතුළේ තෑගි බෝග, කෑම බීම, ඉඳුම් හිටුම් සියලු දේ ලබන අය ඉන්නවා. අපි නෙමෙයි කියන්නේ, මේ බන්ධනාගාර නිලධාරියාගේ කතාව ඇතුළෙ අපිට පැහැදිලිවම ඒක පේනවා.

ඔව්, ඔහු කියන්නේ 'අපි ගන්නේ නෑ', 'අපේ යුනිට් එක ගන්නේ නෑ', 'අපේ කට්ටිය ගන්නේ නෑ'. 'හැබැයි මේකේ ගන්න අය ඉන්නවා. ඒ ගොල්ලෝ ගැන හොයන්න' ඔහු කියන්නේ එහෙමයි. ඒකනේ අපිට ඇහෙන්නේ නැත්තේ. ඔහු ඒ කියන්නේ අනියමින්. අපිට ඔහුගේ කණ්ඩායම නිදොස් කොට නිදහස් කරන්න කලබල




## ඇත්තටම වැරදි කාරයෝ කවු ද?

වෙන්නත් බෑ. ඔහු ඒ කියන ප්‍රකාශය මත අනිත් මිනිස්සු වැරදියි කියලා කියන්න කලබල වෙන්නත් බෑ. හැබැයි මේ සිස්ටම් එක ඇතුළේ මේක වෙනවාමයි කියලා ඕනෑම කෙනෙක් දැනගෙන හිටියා.ප්‍රශ්නය තියෙන්නේ මේ සියලු අඩුපාඩු දැන දැනත් කිසිවෙක් මේකට මැදිහත් නොවී ඉන්න එක. බන්ධනාගාර ඇමැති ඉල්ලා අස්විය යුතුයි කියලා ගොඩක් අය කියනවා. ඔව්, බන්ධනාගාර ඇමැති ඉල්ලා අස්විය යුතුයි. හැබැයි ඔහු ඉල්ලා අස්විය යුත්තේ මේ සිදුවීම හින්දා නෙමෙයි. ඔහු ඉල්ලා අස්විය යුත්තේ ලංකාවේ බන්ධනාගාර කියන පද්ධතිය මේ යන විදිහට ඒකට ඇමැති කෙනෙක් අවශ්‍ය නැති නිසා. ඇමැති කෙනෙක් ඉන්නවා නම් ඔහු මේවට මැදිහත් වෙන්න ඕනෙ, මේවායේ ගැටුම් නිරාකරණය කරන්න ඕනෙ, ගැටලු පිළිබඳ ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කරන්න ඕනෙ. එක පැත්තකින් තියෙනවා බන්ධනාගාර නිලධාරියාට හිතාගන්න බැරි තරම් ප්‍රශ්න කන්දක්. ඔවුන්ට වැටුප් නෑ, නිවාඩු නෑ, සුවපහසු පරිසරයක් නෑ, ඔවුන්ට අවශ්‍ය කරන උපකරණ නෑ, ස්කෑන් කරගන්න විදිහක් නෑ, ඔවුන්ට නිදාගන්න, ගෙදර යන්න එන්න නිවැරදි ක්‍රමවේද මුකුත් හදලා නෑ. එක පැත්තකින් ඔවුන් ඉතා දුෂ්කර ජීවිතයක් ගතකරමින් ඉන්නවා. එතකොට බන්ධනාගාර නිලධාරියාගේ වැටුප ගැන සාකච්ඡා කරන්න, බන්ධනාගාර නිලධාරියාගේ නිවාඩු ගැන සාකච්ඡා කරන්න, එච්චර දෙයක්වත් කරගන්න බැරි නම් ඇමැති ඉල්ලා අස්වෙන්න ඕනෙ තමයි.

අනිත් පැත්තෙන් බන්ධනාගාර රැඳවියෝ. බන්ධනාගාරය කියලා කියන්නේ ගොඩනැගිල්ලට නෙමෙයි, බන්ධනාගාරය කියන්නේ බන්ධනාගාර නිලධාරියාට නෙමෙයි, බන්ධනාගාරය කියලා කියන්නේ රැඳවියන් ඇතුළු සමස්තයට. එතකොට බන්ධනාගාරය තුළ ඉන්න රැඳවියෝ, ඔවුන් දඬුවම්ලාභීන්. ඔවුන් සිරගත කරපු අය, ඔවුන් සමාජයෙන් අයින් කරපු අය. ඒක ඇත්ත. හැබැයි ඇමැති කෙනෙක් ඒ අයට පත්කරලා තියෙනවා නම්, ඒ ඇමැති ඒ පිළිබඳ වරප්‍රසාද ලබනවා නම් ඔහු දැනගන්න ඕනෙ මේ බන්ධනාගාරය තුළ ඉන්න රැඳවියන්ගේ සුවපහසුව, ආරක්ෂාව සහ සියලු දේවල් ගැන වගකීම ගන්න. සුවපහසුව කියලා බන්ධනාගාරය ඒසී කරලා දෙන්න කියලා කියනවා නෙමෙයි. බන්ධනාගාරයේ මිනිස්සුන්ට රෑට දවල්ට උදේට බුරියානි දෙන්න කියනවා නෙමෙයි. හැබැයි කන්න පුළුවන් කෑමක්, නිදාගන්න පුළුවන් පරිසරයක්, ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක්. මේ කිසි දෙයක් හදාගන්නේ නැතුව බන්ධනාගාර ඇමැති ඉල්ලා අස්වෙන්න ඕනෙ තමයි. එතකොට බන්ධනාගාර ඇමැති ඇත්තටම මොනවද කළේ? අපිට ප්‍රශ්න කරන්න පුළුවන්. මේ ඇමැතිගෙන් නෙමෙයි, මීට කලින් හිටපු ඇමැතිලගෙනුත්. මේ පද්ධතිය ඇතුළේ අවුරුදු ගානක් තිස්සේ බන්ධනාගාර සඳහා ඇමැතිවරු පත්කළා. ඒගොල්ලෝ සිරකරු දිනයට ගිහිල්ලා ක්‍රිකට් ගහලා එනවා, බුදු පිළිමවලට මල් පූජා කරනවා, උත්සවවලට සහභාගි වෙනවා, විවෘත කරනවා. තමන්ගේ හොර පෙම්වතියක් ඉන්නවා නම් එයාව බන්ධනාගාර ඇතුළේ තියෙන ලස්සන දේවල් පෙන්නන්න එක්ක යනවා. බන්ධනාගාර ඇමැති කියලා දුරකතන වියදමක් ඔහුට ලැබෙනවා, වාහන ලැබෙනවා, ඔහුට කාර්යාලයක් ලැබෙනවා, ඔහුට නිලධාරී මණ්ඩලයක් තියාගන්න අවස්ථාව ලැබෙනවා. ඔහුට විශාල වරප්‍රසාද ප්‍රමාණයක් ලැබෙනවා. ඒ, බන්ධනාගාර පිළිබඳ අමාත්‍යවරයා විදිහට.

එතකොට බන්ධනාගාර අමාත්‍යවරයා විදිහට ඔවුන් වරප්‍රසාද භුක්ති විඳින්නේ මොනවා කරලද? ඔවුන් හිරකරුවන්ගේ සුබසාධනය වෙනුවෙන් වැඩ කරලත් නෑ, හිරකරුවන්ට අවශ්‍ය කරන පරිසරය නිර්මාණය කරලත් නෑ, ඔවුන්ට නිදාගන්න පුළුවන් තැනක් හදලත් නෑ, උන්ගේ වැසිකිළි පද්ධතිය දියුණු කරලත් නෑ, උන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව හදලත් නෑ, බන්ධනාගාර නිලධාරීන්ට පඩි වැඩි කරලත් නෑ, ඒගොල්ලන්ට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් හදලත් නෑ, ඒගොල්ලන්ගේ නිවාඩු ටික හදලත් නෑ. එතකොට ඒගොල්ලෝ මොනවද කරලා තියෙන්නේ? අවුරුදු ගානක් තිස්සේ ලංකාවේ හිටපු බන්ධනාගාර ඇමැතිලා ඔක්කොම එකතු වෙලා මෙන්න මේ ජූලි 06 වැනිදා ගැටුම දක්වා බන්ධනාගාරය මෙහෙවන එක විතරයි කළේ.

## මේක ඉවර කරන්න බැරි ඇයි?

ප්‍රශ්නය තියෙන්නේ ජූලි 06 වැනිදා ගැටුම ජූලි 07 වැනිදා ඉවර වුණේ නැහැ. 07 වැනිදා අලුත් වටයකින් පටන් ගත්තා. මම මේ ලිපිය ලියන මොහොතෙත් ඔබ ලිපිය කියවන මොහොතෙත් බන්ධනාගාරය ඇතුළේ ගිනි ගන්නවා, බන්ධනාගාරය ඇතුළේ ප්‍රශ්න තියෙනවා, බන්ධනාගාරය ඇතුළේ අපි නොදන්නා ගොඩක් දේවල් සිද්ධ වෙනවා. අවාසනාවකට ඇමැතිලා මළගෙවල්වල ගිහිල්ලා අඬ අඬා ඉන්නවා. ඒ නිසා කරුණාකරලා බන්ධනාගාර අමාත්‍යාංශය ලංකාවෙන් අයින් කරලා දාන්න. ඒකට ඇමැති කෙනෙක් ඕනෙ නෑ. එහෙම ඇමැති කෙනෙක්ට වරප්‍රසාද දෙන්න අවශ්‍ය නෑ. බන්ධනාගාරය කියලා කියන්නේ ඔහේ දුවන ආයතනයක්. යන්නන් වාලේ තියෙන එකක්. බන්ධනාගාරයේ සමස්ත ක්‍රියාවලියේ නිරූපිත සත්‍යය තමයි අර හිලෙන් වෙඩි තියපු එක. ඔන්න ඔය විදිහට තමයි බන්ධනාගාර ලංකාවේ කරගෙන ගියේ. බන්ධනාගාරවල හැම නිලධාරියෙක්ම කළේ ඔය විදිහට හිලෙන් වෙඩි තියෙන එක තමයි. ඒ කියන්නේ වදින එකෙකුට වදින්න වෙඩි තියෙනවා, වදින එකෙකුට වදින්න වැඩ කරනවා, කන එකෙකුට කන්න කෑම දෙනවා, ඉන්න එකෙකුට ඉන්න පරිසරය හදනවා, නිදාගන්න එකෙකුට නිදාගන්න හදනවා, වැසිකිළි යන එකෙකුට වැසිකිළි යන්න වැසිකිළි හදනවා. හැමෝටම එක විදිහට සලකන්නවත්, තෝරලා බේරලා වරප්‍රසාද ටික ලබාදෙන්නවත් මේගොල්ලෝ දන්නෙත් නැහැ, මේගොල්ලෝ හිතුවෙත් නැහැ, මේගොල්ලන්ට ඒකෙන් ඇති වැඩකුත් නැහැ.



ජීවන පහන් තිළිණ

# හිටපු පොලිස්පති මැරුවද? මැරුණද?

**ශ්‍රී ලංකා පොලිස් ඉතිහාසයේ 35 වැනි පොලිස්පතිවරයා වූ චන්දන දිල්රුක් වික්‍රමරත්න (සී.ඩී. වික්‍රමරත්න) මියයෑම රට තුළ දැඩි අවධානයට ලක්ව තිබේ. ප්‍රධාන මාධ්‍ය වාර්තා කිහිපයකට අනුව තලාහේන ප්‍රදේශයේ පිහිටි ඔහුගේ නිවසේදී වෙඩිවැදීමක් හේතුවෙන් මෙම මරණය සිදුව ඇති බව සඳහන් වුවද, මරණයට නිශ්චිත හේතුව මෙතෙක් නිල වශයෙන් ප්‍රකාශයට පත්කර නොමැත. එබැවින් පශ්චාත් මරණ පරීක්ෂණය, මහෙස්ත්‍රාත් පරීක්ෂණය සහ පොලිස් විමර්ශන අවසන් වන තෙක් මෙම සිද්ධිය සම්බන්ධයෙන් අවසන් නිගමනවලට එළඹීම සුදුසු නොවේ.**

සී.ඩී. වික්‍රමරත්න මහතා 2019 පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව වැඩබලන පොලිස්පතිවරයා ලෙස පත්වූ අතර, 2020 නොවැම්බර් 25 දින ස්ථිර පොලිස්පතිවරයා ලෙස පත්කෙරිණි. ඔහු 2023 නොවැම්බර් මාසය දක්වා එම ධුරයේ කටයුතු කළේය. මෛත්‍රීපාල සිරිසේන, ගෝඨාභය රාජපක්ෂ සහ රනිල් වික්‍රමසිංහ යන ජනාධිපතිවරුන් තිදෙනාගේ පාලන කාලවලදී පොලිස්පති ධුරයේ සේවය කළ නිලධාරියකු ලෙසද ඔහු ඉතිහාසයට එක්වෙයි.

ඔහුගේ සේවා කාලය තුළ පාස්කු ප්‍රහාරය සම්බන්ධ විමර්ශන, ජාතික ආරක්ෂාව හා ත්‍රස්ත මර්දන කටයුතු ප්‍රමුඛත්වයට පත්විය. විශ්‍රාම ලැබීමෙන් පසුවද පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පවතින විමර්ශනවලදී ඔහු වැදගත් සාක්ෂි රැසක් ලබා දුන්නේය. අධිකරණය හමුවේ ලබාදුන් සාක්ෂි අනුව, 2019 අප්‍රේල් 26 දින අම්පාර කොට්ඨාසයේ නිලධාරීන් විසින් සිදුකිරීමට නියමිත සයින්දමරුදු වැටලීම සඳහා යුද හමුදා සහ විශේෂ කාර්ය බළකායේ සහාය ලබාදීමට තමන් මැදිහත් වූ බව ඔහු ප්‍රකාශ කර තිබිණි. එම වැටලීමේදී පාස්කු ප්‍රහාරයට සම්බන්ධ ත්‍රස්තවාදීන් කිහිපදෙනෙකු මියගිය බව පසුව නිල වාර්තාවල සඳහන් විය.

සී.ඩී. වික්‍රමරත්න මහතාගේ සාක්ෂියේ වැඩිම අවධානයට ලක්වූ කොටසක් වූයේ සයින්දමරුදු සිද්ධියේදී සාරා ජෙස්මින් මියගියේද යන්න පිළිබඳ සිදු වූ ඩී.එන්.ඒ. පරීක්ෂණ සම්බන්ධ කරුණුය.

ඔහුගේ සාක්ෂියට අනුව, පළමු සහ දෙවැනි ඩී.එන්.ඒ. වාර්තා මගින් සාරා ජෙස්මින්ගේ මරණය තහවුරු නොවූ අතර, ඒ හේතුවෙන් ආරක්ෂක කවුන්සිලයේදී මේ සම්බන්ධයෙන් දීර්ඝ සාකච්ඡා පැවැත්වුණි. ඉන් අනතුරුව සිදුකළ තුන්වැනි පරීක්ෂණයෙන් ඇය මියගොස් ඇති බව තහවුරු වූ බව ඔහු අධිකරණයට දැනුම් දුන්නේය.

ඔහුට එරෙහිව එම ඩී.එන්.ඒ. වාර්තාව ලබාගැනීම සම්බන්ධයෙන් ඇතැම් චෝදනාද එල්ල වූ නමුත්, ඒවා ප්‍රතික්ෂේප කළ ඔහු, තමන් රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවට ගියේ බන්ධනාගාරවල තදබදයට හේතු වූ මත්ද්‍රව්‍ය නඩු ප්‍රමාදය පිළිබඳ සාකච්ඡා කිරීමට පමණක් බව අධිකරණයට ප්‍රකාශ කර තිබිණි.

සිය සාක්ෂියේදී, පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් ආරක්ෂක කවුන්සිලයේ පැවැති සාකච්ඡා පිළිබඳවද ඔහු කරුණු අනාවරණය කළේය. සාරා ජෙස්මින් සම්බන්ධ විමර්ශනයේ ප්‍රගතිය, ඩී.එන්.ඒ. පරීක්ෂණ සහ ඉදිරි විමර්ශන දිශාව පිළිබඳ එහිදී නිරන්තරයෙන් අවධානය යොමු වූ බව ඔහු ප්‍රකාශ කළේය.

හිටපු පොලිස්පතිවරයාගේ හදිසි මරණයත් සමග ඔහු ලබාදුන් මෙම සාක්ෂි නැවතත් මහජන අවධානයට ලක්ව තිබේ. එහෙත්, ඔහුගේ මරණය සහ පාස්කු විමර්ශන අතර සම්බන්ධතාවක් පවතින බවට මෙතෙක් කිසිදු නිල ආයතනයක් ප්‍රකාශ කර නොමැති අතර, එවැනි සම්බන්ධතාවයක් පවතින බවට තහවුරු කරන සාක්ෂිද මෙතෙක් ඉදිරිපත් වී නැත. ඒ නිසා මෙම මරණය සම්බන්ධයෙන් නිල විමර්ශන අවසන් වන තෙක් එය සියදිවි නසා ගැනීමක්ද, වෙනත් ආකාරයක මරණයක්ද යන්න පිළිබඳව පූර්ව නිගමනවලට එළඹීම වගකීම්සහගත මාධ්‍ය භාවිතයට නොගැළපේ.

එහෙත්, රටේ ඉතා සංවේදී ආරක්ෂක සිද්ධියක් සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් සාක්ෂි ලබාදුන් ඉහළම පොලිස් නිලධාරියකුගේ හදිසි මරණය සම්බන්ධයෙන් සිදුකෙරෙන නිල විමර්ශනය කෙරෙහි මහජන විශ්වාසය තහවුරු වන ආකාරයෙන් සම්පූර්ණ විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම අදාළ සියලු ආයතනවල වගකීම බවට සැකයක් නැත.

මාර්කස් ප්‍රනාන්දු



## මොකක්ද මේ අබිරහස?

PAGE - 07

තවදුරටත් ලබාදීමට කැප වන බව තානාපතිවරයා මෙහිදී නැවත තහවුරු කළේය.

වොෂින්ටන් බෞද්ධ විහාරයේ විහාරාධිපති පූජ්‍ය මහරගම ධම්මසිරි හිමියන්ගේ මග පෙන්වීම යටතේ සංවිධානය කරන ලද මෙම උත්සවය සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලා 16 නමක්, ශ්‍රී ලාංකික ප්‍රජාව සහ සුබ පතන්නන් රැසක් සහභාගී වූහ.

කෙසේ වෙතත් මෙහිදී සිදුකළ කතාවේදී මහින්ද සමරසිංහ විශේෂ කරුණු රැසක්ද පළමු වරට හෙළිදරව් කිරීමට පියවර ගත්තේය. එහිදී මහින්ද කියා සිටියේ කිසිවකුත් තමන්ට තනතුරෙන් ඉවත් වීමට දැනුම් නොදුන් බවත්, තමන්ගේ අවශ්‍යතාව මත පමණක්ම එම තනතුරෙන් ඉවත් වීමට තමන් තීන්දු කළ බවත්ය. එමෙන්ම සිය අවසන් කතාව කරද්දී මහින්ද රට වෙනුවෙන් කළ තවත් විශාල කර්තව්‍යයක් සම්බන්ධයෙන් යම් ඉඟියක් පළකිරීමට පියවර ගත්තේය. එහිදී ඔහු කියා සිටියේ 19% ක් වූ තීරුබද්ද සම්බන්ධයෙන්ද ඉදිරියේදී තවත් සුබදායී පුවතක් ශ්‍රී ලංකාවට අසන්නට ලැබෙනු ඇති බවය.

මේ අතර, පසුගිය සතියේදී මහින්ද සමරසිංහ මහතා තවත් විශේෂ රාජකාරියක්ද සිදුකළේය. ඒ, එක්සත් ජනපදයේ 250 වැනි නිදහස් සංවත්සරය සංවිධාන කිරීම සඳහා තානාපති කාර්යාලය මගින් ප්‍රකාශයට පත්කරන ලද 'කොෆි ටේබල්' ග්‍රන්ථයෙහි පළමු පිටපත ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දේශපාලන කටයුතු භාර රාජ්‍ය ලේකම් ඇලිසන් හූකර් මහත්මිය වෙත පිළිගැන්වීමට කටයුතු කිරීමය. එහිදී හූකර් මහත්මිය පසුගිය තීරණාත්මක කාලවකවානුවේදී ලංකාව වෙනුවෙන් මහින්ද සමරසිංහ සිදුකරනු ලැබූ මෙහෙය පිළිබඳ විශේෂ සිතුතියක් පිරිනැමීමටද පියවර ගත්තාය. එමෙන්ම ආසියානු මධ්‍යම හා දකුණු කලාපය භාර ඇමෙරිකානු රාජ්‍ය ලේකම්වරයා වන පෝල් කපූර් මහතා මුණගැසී සාකච්ඡා කිරීමටද මහින්ද සමරසිංහ පියවර ගත්තේය. මීට අමතරව සිදුවූ විශේෂම සිදුවීම වූයේ ඇමෙරිකානු රාජ්‍ය ලේකම්වරයා වන මාර්කෝ රූබියෝ මහතා හමුවී ඔහු සමගද විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමට මහින්ද සමරසිංහ කටයුතු කර තිබීමය.

කෙසේ වෙතත් සිය රාජකාරි අවසන් කොට මහින්ද ලංකාවට පැමිණීමට නියමිතව ඇත්තේ ලබන 31 වැනිදාය. මහින්දගේ ශ්‍රී ලංකාගමනය සැලවීමත් සමග බොහෝ දේශපාලන පක්ෂ මෙන්ම දේශපාලන නායකයන්ද යළිත් මහින්දව දේශපාලනයට ගැනීම සඳහා දැනටමත් ඔහු සමග සාකච්ඡා කිහිපයක්ම සැලසුම් කොට ඇති බවක් ආරංචිය. එමෙන්ම දැනටමත් කෙටි පණිවුඩ මගින් මහින්දට ඒ බව දැනුම් දී ඇති බවක්ද ආරංචිය. කෙසේ වෙතත් අපට ඇති තොරතුරුවලින් නම් කියැවෙන්නේ මේ කිසිදු යෝජනාවක් භාර නොගැනීමට මහින්ද තීරණය කොට ඇති බවකි. එමෙන්ම ආණ්ඩුව පැත්තෙන්ද දැනටමත් මහින්ද වෙනුවෙන් විශේෂ තනතුරක් සූදානම් කොට ඇති බවක්ද 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. නමුත් ඒ සම්බන්ධයෙන්ද මහින්ද කිසිදු තීන්දුවක් ගෙන නොමැති බවක් ආරංචිය. මහින්ද තීරණය කොට ඇත්තේ කිසිදු දේශපාලන පක්ෂයකට හෝ තනතුරකට සීමා නොවී තමන් ගොඩනගාගත් අත්දැකීම්වලින් සහ සම්බන්ධතාවලින් රට මුහුණ දෙන ප්‍රශ්නවලට සිය උපරිම ධාරිතාවයෙන් උදව් උපකාර කිරීමටය.

කපිල පුංචිමාන්නගේ

කොළඹ 05, තිඹිරිගස්යාය, ජයරත්න මාවත, අංක 22හි පිහිටි ශ්‍රී මීඩියා ඉන්ඩිපෙන්ඩන්ට් නෙට්වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම විසින්, මත්තේගොඩ නිවාස සංකීර්ණය පාර, අංකඃ 102/176හි පිහිටි සයුරි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේදී 2026 ජූලි 19 වැනි ඉරිදා මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.